ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

# 2023 වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT



# වාර්ෂික වාර්තාව 2023

ශ්‍රී ලංකා සංවර්ධන
පරිපාලන ආයතනය



Power BI
Desktop



# වාර්ෂික වාර්තාව 2023

ශ්‍රී ලංකා සංවර්ධන
පරිපාලන ආයතනය



**වාර්ෂික වාර්තාව - 2023**

**ප්‍රකාශනය**
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

නො. 28/10, මලලසේකර මාවත, කොළඹ 07, ශ්‍රී ලංකා.
+94-11-5980200 | info@slida.gov.lk

Printed with VOC free, non toxic vegetable oil-based environmentally-friendly ink, on 100% recycled paper using wood free pulp which is made from 100% post consumer waste paper (Paper recycling is the process of recovering waste paper and remarking it into new paper products.)

Recycling one ton of paper saves17 mature trees, 26 m3 of water, 2.3 m3 of disposal space, 320 liters of oil, and 4,100 kilowatt-hours of electricity.

We encourage you to recycle this Document after use.

# පටුන


**1. වඩා යහපත් හෙට දිනක් උදෙසා රාජ්‍ය අංශය සවිබල ගැන්වීම 7**
දැක්ම 7
මෙහෙවර 7
උපායමාර්ගික ඉලක්ක 8
ප්‍රධාන කාර්යයන් 8
අපගේ අගනාකම් 8
උපායමාර්ගික අභිප්‍රාය 8
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්/
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලක සභාවේ සභාපතිතුමාගේ පණිවිඩය 9
අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය 10

**2. මූල්‍ය ප්‍රකාශන 11**
2.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 11
2.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය 12
2.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 13
2.4 ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය 14
2.5 2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 15

**3. පාලක සභාවේ සාමාජිකයන් 19**

**4. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය හා අධ්‍යයනේන්ද්‍රිය කාර්ය මණ්ඩලය 20**

**5. සේවා පහසුකම් සපයන්නන්ගේ තොරතුරු 25**

**6. ක්‍රියාකාරී සහ ආයතනික ව්‍යුහය 27**

**7. ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් - 2023 29**
7.1 සේවාරම්භක පුහුණු වැඩසටහන් 29
7.2 දීප ව්‍යාප්ත සේවාවන් සඳහා අනිවාර්යය ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් 30
7.3 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පවත්වන ලද ධාරිතා සංවර්ධන වැඩසටහන 31
7.4 කෙටි කාලීන පුහුණු වැඩසටහන් 31
7.5 ඩිප්ලෝමා වැඩසටහන් 32
7.6 ආයතනික ඉල්ලීම් ප්‍රකාරව අවශ්‍යතානුකූලව සකස් කරන ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් 32
7.7 2023 වර්ෂයේ නව්‍ය ප්‍රවේශය 34
7.8 අධ්‍යයන මණ්ඩලයක් (Academic Board) ස්ථාපනය කිරීම 34
7.9 Credit Based Qualification System 34

**8 ආයතනික සංවර්ධන අංශය 35**
8.1 2023 වර්ෂය තුළ දී දේශීය ආයතන සමඟ ජාලගතවීම 36
8.2 විදේශ ආයතන සමඟ සහයෝගීතාවයන් 36
8.3 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ආයතනික වැඩිදියුණු කිරීම් 37

**9 පශ්චාත් උපාධි අධ්‍යයන අංශය (SPS) 38**
9.1 පසුබිම 38
9.2 ආරාධිත දේශන මාලාව 38
9.3 පශ්චාත් උපාධි වැඩසටහන්වල ගුණාත්මක බව සහතික කිරීම 39
9.4 එක් අවුරුදු රාජ්‍ය කළමනාකරණ පශ්චාත් උපාධි වැඩසටහන 39

**10 2023 වර්ෂයේ දී පවත්වන ලද විභාග 40**
10.1 අභ්‍යන්තර විභාග - 2023 40
10.2 බාහිර විභාග - 2023 41

**11. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය 45**

**12. භාෂා අධ්‍යයන මධ්‍යස්ථානය 48**

**13. "සංධරණී" පර්යේෂණ මධ්‍යස්ථානය 51**

**14. පොදු පරිපාලනය 53**
14.1 කාර්ය මණ්ඩල තොරතුරු 53
14.2 2023 වර්ෂය තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම 54

**15. පුස්තකාල සහ තොරතුරු සේවා - ආචාර්ය එච්.එස්.වනසිංහ පුස්තකාලය 55**

**16. විශේෂ සිද්ධි සහ ජයග්‍රහණයන් 57**

**17. විගණන කමිටු වාර්තාව - 2023 66**

# වඩා යහපත් හෙට දිනක් උදෙසා රාජ්‍ය අංශය සවිබල ගැන්වීම

# 01

1982 අංක 9 දරන පාර්ලිමේන්තු පනත මඟින් රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශය යටතේ සංස්ථාපිත ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) 1982 මැයි මාසයේ දී ස්ථාපනය කරන ලදී. රාජ්‍ය අංශයේ විධායක නිලධාරීන්ගේ දක්ෂතා වැඩිදියුණු කිරීම හා වෘත්තීය ප්‍රගමනයෙහිලා වගකීම පැවරී ඇති ප්‍රමුඛතම ආයතනය මෙම ආයතනයයි.

සිය ප්‍රමුඛතම හරයාත්මක වටිනාකම වන ජනතා යහපත මුදුන්පත් කිරීම ඉටු කරන අතර, රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම, රාජ්‍ය අංශයේ ආයතන සඳහා කළමනාකරණ උපදේශකත්වයන් ලබාදීම හා පර්යේෂණ කාර්යයන් දිරිගැන්වීම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ප්‍රධානතම ක්‍රියාකාරී ක්ෂේත්‍රයන් වේ.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත පශ්චාත් උපාධි පිරිනැමීමේ තත්ත්වය ලබා දී තිබේ. ඒ අනුව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය විසින් රාජ්‍ය කළමනාකරණ පශ්චාත් උපාධිය හා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ප්‍රදානය කරනු ලැබේ. ප්‍රධාන විධායක නිලධාරීන්, කළමනාකරුවන් හා අනෙකුත් පාර්ශවකරුවන් වෙතින් ඉහළ මට්ටමේ දායකත්වයක් අපේක්ෂා කරන ඉතා සීඝ්‍රයෙන් වෙනස්වන හා අභියෝගාත්මක වර්තමාන රාජ්‍ය කළමනාකරණ සංදර්භයේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා මෙම අධ්‍යයන වැඩසටහන් හඳුන්වා දී තිබේ.

රාජ්‍ය පරිපාලනය පිළිබඳ විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ණ මඟපෙන්වීම යටතේ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලක සභාව විසින් ආයතනයේ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් තීරණය කිරීමේ වගකීම දරනු ලබයි.

**දැක්ම**

රාජ්‍ය අංශයේ ඉගෙනුම් හා සංවර්ධන ක්‍රියාවලියෙහි ආසියාවේ විශිෂ්ටතම මධ්‍යස්ථානය බවට පත්වීම

**මෙහෙවර**

ඉගෙනුම සහ සංවර්ධනය, උපදේශක සේවා සහ පර්යේෂණ මඟින් නිර්මාණශීලි, අනාගත දැක්මක් සහිත සහ පුරවැසි කේන්ද්‍රීය වූ රාජ්‍ය සේවයක් සඳහා අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා පහසුකම් සැලසීම

### උපායමාර්ගික ඉලක්ක

- වඩාත් සක්‍රීය හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් බිහිකිරීමෙහිලා වන ජාතික සංවර්ධන ඉලක්කයට දායකවීම
- ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා දායකවීමේ දී ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකිරීම.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පිළිබඳව එහි පාර්ශවකරුවන් අතර ධනාත්මක ප්‍රතිරූපයක් ගොඩ නැංවීම තුළින් එහි ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා වන ඉල්ලුම ඉහළ නැංවීම.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, දකුණු හා අග්නිදිග ආසියාවේ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සංවර්ධනය සඳහා වන සහයෝගීතා මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.

### ප්‍රධාන කාර්යයන්

- ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් මාලාවක් ඔස්සේ රාජ්‍ය අංශයේ කළමනාකරණ කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය.
- පශ්චාත් උපාධි වැඩසටහන් මඟින් රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති හා කළමනාකරණයට අදාළව කාර්ය සාඵල්‍යතාවය අරමුණු කරගත් පර්යේෂණ අධ්‍යයනවල කෝෂ්ඨාගාරය දියුණු කිරීම.
- රාජ්‍ය අංශයේ ආයතනවල හා රජය සතු ව්‍යවසායන්ගේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා ආයතනික සංවර්ධන සේවා පැවැත්වීම.
- රාජ්‍ය අංශය සඳහා බඳවා ගැනීමේ විභාග, කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ භාෂා ප්‍රවීණතා විභාග පැවැත්වීම.





## රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්/ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලක සභාවේ සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව සඳහා මෙම සංක්ෂිප්ත පණිවිඩය එක් කරනුයේ හදපිරි සතුටිනි. කළමනාකරණ මට්ටමේ නිලධාරීන්ගේ නිපුණතා හැඩ ගැස්සවීම ප්‍රතිඵල වන නායකත්වය සහ නව්‍යතාවය වැඩිදියුණු කිරීමෙහි ලා වූ විවිධ නව වැඩසටහන් සහ දැනට ක්‍රියාත්මක වැඩසටහන් වෙනස් කිරීම් හඳුන්වාදෙමින් පුහුණු සහ සංවර්ධන වැඩසටහන්වලට අදාළ සිය ක්‍රමෝපායික ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් මෙම වර්ෂයේ දී විවිධ පියවර ගෙන තිබේ.

රාජ්‍ය සේවකයන් සඳහා වූ විශාලතම පුහුණු ආයතනය වශයෙන් වැදගත් භූමිකාවක් ඉටු කරන අතරම ගෙවීගිය වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සියලුම ක්ෂේත්‍ර ඔස්සේ අඛණ්ඩව සිය කාර්යය පුළුල් කිරීම විශේෂයෙන් සතුටට කරුණකි. අමාත්‍යාංශය විසින් නියෝග කළ පරිදි, මෙම වර්ෂය තුළ දී දීපව්‍යාප්ත සේවාවන් සඳහා අලුතින් බඳවාගත් නිලධාරීන් 246ක් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන් හතරක් සහ එම සේවාවල නිලධාරීන් 510ක් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් හතරක් පවත්වා තිබේ. මීට අමතරව, අලුතින් උසස්වීම් ලද විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් 31 දෙනෙකු සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහනක් ද පවත්වන ලද අතර මෙය ආයතනය විසින් දියත් කරන ලද නව මූලාරම්භයකි.

රටට අවශ්‍ය කරන සුදුසුකම් සපිරි පරිපාලකයන් බිහිකිරීම සඳහා වසර මුළුල්ලේම කෙටි කාලීන පුහුණු වැඩසටහන්, ඩිප්ලෝමා වැඩසටහන් සහ පශ්චාත් උපාධි වැඩසටහන් ද පවත්වා තිබේ. තව ද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් මෙම වර්ෂය තුළ දී විවිධ ආයතන සඳහා කළමනාකරණ උපදේශකත්ව සහ ආයතනික ඉල්ලීම් ප්‍රකාරව, අවශ්‍යතානුකූලව සකස් කරන ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් කිහිපයක් ද සිදුකළ බව විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

එමෙන්ම, Credit Based Qualification System (CBQS), ඉහළ ගුණාත්මකභාවයකින් යුතු පුහුණුවීම් ලබාදීමට සහ සහභාගිකයන් වෙත සුහදශීලී ඉගෙනුම් අත්දැකීමක් ගොඩනැංවීම උදෙසා වර්ෂයේ එක් එක් කාලසීමා තුළ සංසද මාලාවන් පැවැත්වීම සඳහා අධ්‍යයන මණ්ඩලයක් (Academic Board) ස්ථාපනය කිරීම වැනි විවිධ ක්‍රමවේද ඔස්සේ සිය සේවා සැපයුම වැඩි දියුණු කිරීම සඳහා මෙම ආයතනය විසින් අඛණ්ඩවම ප්‍රයත්න දරනු ලැබේ.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සේවා විශිෂ්ටත්වය ශක්තිමත් කිරීම උදෙසා සවිමත් සහාය හා මඟ පෙන්වීම ලබාදීම වෙනුවෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සහ පාලක මණ්ඩලයේ සාමාජිකයන් වෙත මාගේ හද පිරි කෘතඥතාවය පළ කරමි. තවද සිය අඛණ්ඩ සහ නිබැඳි ප්‍රයත්නයන් ඔස්සේ ආයතනික ගමන් මඟ වෙත වටිනාකම් එකතු කරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සහ කාර්ය මණ්ඩලයේ කැපවීම සහ උනන්දුව ද අගය කරමි.

**කේ.ඩී.එන්. රංජිත් අසෝක**
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය



## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2023 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාවට මෙම පණිවිඩය එකතු කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකමි. පසුගිය වසර කිහිපය මුළුල්ලේ අප බොහෝ අභියෝග සහ අසීරුතාවන්ට මුහුණ පෑ අතර, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සිය පූර්ණ විභවයෙන් කටයුතු කිරීමේ හැකියාව කෙරෙහි එය අනිවාර්යෙන් බලපාන ලදී. 2023 වර්ෂය ඇරඹීමත් සමඟින් ඇතිවූ අතිරේක අභියෝග ඔස්සේ අපගේ වාර්ෂික විෂයමාලා සඳහා සුවිශේෂී ගැලපීම් සිදුකිරීමට සහ සහභාගිකයන්ගේ උනන්දුව වැඩි කිරීම උදෙසා අපගේ ක්‍රමෝපාය සම්බන්ධයෙන් නැවත සිතා බැලීමටත් රාජ්‍ය සේවය තුළ විවිධ වූ අංශ කරා අපගේ සේවා පුළුල් කිරීමටත් අප විසින් කටයුතු කරන ලදී.

මෙම අභියෝග මධ්‍යයේ වුව ද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් සුවිශේෂී ජයග්‍රහණයන් අත්පත් කරගෙන ඇත. අපගේ සාමාන්‍ය පුහුණු වැඩසටහන්, ඩිප්ලෝමා වැඩසටහන්, සහ පශ්චාත් උපාධි වැඩසටහන්වලට අමතරව, තොරතුරු තාක්ෂණයේ අඛණ්ඩ වැඩිදියුණුවීම් ඔස්සේ අපගේ කේන්ද්‍රීය ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කරන ලදී. අපගේ අධ්‍යයන කටයුතු කාර්යක්ෂමව සහ මනාව සංවිධිත කිරීමට හා වැඩිදියුණු කිරීම උදෙසා අප විසින් Credit Based Qualification System (CBQS) සහ Centralized Academic Management System (CAMS) යන පද්ධති මෙම වර්ෂයේ දී හඳුන්වාදෙන ලදී. අපගේ පාර්ශවකරුවන් වෙත නව්‍යතම දැනුම ලබාදීම සඳහා වන අපගේ කැපවීම විදහාපාමින් මෙම පද්ධති 2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

අප විසින් 2023 වර්ෂය තුළ නව්‍ය මුලාරම්භ කිහිපයක් ද දියත් කරන ලදී. මෑතක දී ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන් සඳහා වූ වැඩමුළු මාලාව, රාජ්‍ය අංශයේ විවිධ අංශවල සේවය කර විශ්‍රාම ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් යුතු උපදේශකත්ව වැඩසටහනක් (Mentorship Programme) සහ SLIDA සංසදය (SLIDA Forum) මීට ඇතුළත් ය. අපගේ සේවා සැපයීම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා දේශීය ආයතන සමඟ ජාලගතවීම් සිදුකරන ලද අතර ජාත්‍යන්තර ආයතන කිහිපයක් සමඟ ද සහයෝගීතාවයන් ඇතිකර ගන්නා ලදී. පුහුණු අවස්ථා සැපයීමෙන් ඔබ්බට ගොස්, රාජ්‍ය ආයතනවල ආයතනික ධාරිතාවයන් වැඩිදියුණු කිරීම සඳහා විවිධ ආකාරවලින් සහාය ලබාදෙමින් රාජ්‍ය ආයතන සඳහා කළමනාකරණ උපදේශන සහ ආයතනික ඉල්ලීම් ප්‍රකාරව, අවශ්‍යතානුකූලව සකස් කරන ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් කිහිපයක් ද අප විසින් සක්‍රිය ආකාරයෙන් පිරිනමන ලදී. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ භාෂා අධ්‍යයන මධ්‍යස්ථානය විසින් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමඟ පස් අවුරුදු අවබෝධතා ගිවිසුමක් ද අත්සන් තබන ලදී.

අභ්‍යන්තර විභාග සහ විවිධ රාජ්‍ය ආයතනවල ඉල්ලීම් අනුව බාහිර විභාග පැවැත්වීම සඳහා අපගේ විභාග අංශය විසින් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදී. ආයතනික ඉලක්ක සපුරාගැනීමෙහිලා අපගේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ අගනා දායකත්වය පිළිගනිමින්, කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ සාමූහිකව කටයුතු කිරීම සහ කණ්ඩායම් හැඟීම වැඩිදියුණු කිරීම උදෙසා අප විසින් ආයතන පරිශ්‍රයෙන් බැහැරව පුහුණු වැඩසටහනක් ද සංවිධානය කරන ලදී.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ආයතනික විශිෂ්ටත්වය උදෙසා වන අපගේ අඛණ්ඩ ප්‍රයත්නය උදෙසා සිය අඛණ්ඩ මඟ පෙන්වීම හා සහාය වෙනුවෙන් ගරු අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්, පාලක මණ්ඩලයේ සාමාජිකයන් සහ සියලුම පාර්ශවකරුවන් වෙත මාගේ කෘතඥතාවය පළ කරමි. රාජ්‍ය අංශයේ ප්‍රමුඛතම ඉගෙනුම් සහායකයා වශයෙන් අග්‍රගණ්‍ය සේවාවක් සැපයීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ක්‍රමයෙන් වැඩිදියුණු වන අතර අනාගතයේ දී අඛණ්ඩව වර්ධනය වනු ඇත.

**නාලක කලුවැව**
අධ්‍යක්ෂ ජනරාල්

# මූල්‍ය ප්‍රකාශන

**02**

## 2.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**2023 දෙසැම්බර් 31 වන දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන් | 2023 | 2022 ප්‍රතිප්‍රකාශිත |
|---|---|---|---|
| **වත්කම්** | | රු. | රු. |
| **ජංගම වත්කම්** | | | |
| බැංකු ශේෂ | 03 | 10,977,881 | 4,823,198 |
| ත්‍රෛමාසික තැන්පතු | 04 | 398,229,237 | 360,433,085 |
| ලැබිය යුතු ශේෂ | 05 | 29,971,345 | 37,764,609 |
| අතැති තොග | 06 | 7,150,573 | 7,419,605 |
| ඉදිරියට කරන ලද ගෙවීම් | 07 | 4,389,155 | 1,849,143 |
| අත්තිකාරම් | | 69,802 | 69,802 |
| කාර්ය මණ්ඩල ණය | 08 | 12,736,525 | 14,733,066 |
| | | **463,524,517** | **427,092,508** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 09 | 466,024,712 | 483,932,171 |
| මායිම් තාප්පය - කෙරීගෙන යමින් පවතින වැඩ | | 3,798,113 | |
| පාරිතෝෂික අරමුදල් ආයෝජනය | 10 | 52,893,624 | 46,534,724 |
| තැන්පතු ගිණුම් | 11 | 1,299,500 | 1,299,500 |
| | | **524,015,949** | **531,766,395** |
| **මුළු වත්කම්** | | **987,540,466** | **958,858,903** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු තැන්පතු | 12 | 12,543,668 | 17,537,263 |
| ඉදිරියට ලැබීම් | 13 | 62,974,008 | 72,037,753 |
| උපචිත වියදම් | 14 | 13,535,813 | 9,145,633 |
| ලැබීම් අවිනිශ්චිතතා සඳහා වෙන්කිරීම් | | 1,427,240 | 2,273,387 |
| | | **90,480,729** | **100,994,037** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථාන සමාගම | 15 | 14,895,531 | 16,550,589 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 16 | 31,625,875 | 34,995,448 |
| | | **46,521,406** | **51,546,037** |
| **මුළු වගකීම්** | | **137,002,135** | **152,540,073** |
| **ශුද්ධ වත්කම්** | | **850,538,331** | **806,318,830** |
| **ශුද්ධ වත්කම් / හිමිකම්** | | | |
| විලම්බිත ආදායම - භාණ්ඩාගාර ප්‍රදාන | | **491,907,397** | **509,487,842** |
| වෙනත් සංචිත - වත්කම් ප්‍රත්‍යාගණන සංචිත | 17 | **161,165,157** | **161,165,157** |
| සමුච්චිත අතිරික්තය / ඌනතාවය | 18 | **197,465,777** | **135,665,830** |
| **මුළු ශුද්ධ වත්කම් / හිමිකම්** | | **850,538,331** | **806,318,830** |

## 2.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

**2023 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

| | සටහන් | 2023<br>රු. | 2022 ප්‍රතිප්‍රකාශිත<br>රු. |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| භාණ්ඩාගාර දායකත්වය | 19 | 147,580,445 | 132,175,368 |
| **වෙනත් ආදායම්** | | | |
| පාඨමාලා ගාස්තු | 20 | 178,500 | 416,000 |
| ශාලා කුලියට දීම | | 21,544,987 | 13,644,692 |
| ප්‍රකාශන අලෙවි කිරීම | | 100,004 | 63,013 |
| ආයෝජන මඟින් ලැබූ ආදායම | 21 | 76,601,278 | 60,316,934 |
| ණය පොලී | | 574,518 | 594,444 |
| කුලී ආදායම් | 22 | 19,804,864 | 16,010,755 |
| කල්බදු කුලී | | 1,655,059 | 1,655,059 |
| පශ්චාත් උපාධිය අංශය | | 1,783,970 | 10,266,155 |
| භාෂා වැඩසටහන් | | 3,089,500 | 1,655,550 |
| උපදේශන සේවා | 23 | 22,548,578 | 19,602,043 |
| ආදායමෙන් ආයතනික පංගුව | | 10,799,352 | 5,906,611 |
| ආධාර / ප්‍රදානයන් | | 17,100 | 7,500 |
| අවිනිශ්චිත ලැබීම් සඳහා අධි වෙන් කිරීම් | 24 | 846,147 | - |
| විවිධ ආදායම් | 25 | 32,089,062 | 10,032,361 |
| **මුළු ආදායම** | | **339,213,363** | **272,346,486** |
| **වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | 26 | 124,584,837 | 131,598,958 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | 27 | 5,343,261 | 3,967,016 |
| ගමන් වියදම් , යැපීම් සහ දීමනා | 28 | 1,300,508 | 612,597 |
| උපයෝගීතා සහ අනෙකුත් සේවා | 29 | 38,982,451 | 29,345,288 |
| ප්‍රවාහන | 30 | 6,885,235 | 4,165,943 |
| ස්ථාවර වත්කම් අලුත්වැඩියාව හා නඩත්තු කිරීම | 31 | 14,454,004 | 4,638,823 |
| සැපයුම් සහ අවශ්‍යතා | 32 | 6,789,322 | 5,335,357 |
| මූල්‍ය ගාස්තු | 33 | 3,881,521 | 896,090 |
| විගණන ගාස්තු | | 1,179,800 | 964,000 |
| පුස්තකාල සේවා | 34 | 272,933 | 182,294 |
| පුහුණු හා ඇගයීම් | 35 | 1,349,527 | 234,980 |
| ප්‍රකාශන හා තොරතුරු සේවා | 36 | 33,215 | 43,596 |
| ක්ෂය කිරීම් | 37 | 30,958,260 | 34,424,870 |
| පශ්චාත් උපාධි අධ්‍යයන අංශය | 38 | 12,042,012 | 8,271,395 |
| භාෂා වැඩසටහන් | 39 | 4,055,324 | 894,790 |
| උපදේශන සේවා | 40 | 22,548,578 | 19,602,043 |
| පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන් කිරීම් | | 2,186,733 | 4,924,108 |
| පර්යේෂණ හා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් | 41 | 565,898 | 330,354 |
| අනෙකුත් ආයතන වෙත වත්කම් මාරු කිරීම | 42 | - | 875,000 |
| අවිනිශ්චිත ලැබීම් සඳහා වෙන් කිරීම් | | - | 358,811 |
| **මුළු වියදම්** | | **277,413,417** | **251,666,312** |
| **කාලසීමාව සඳහා අතිරික්තය / (ඌණතාවය)** | | **61,799,947** | **20,680,174** |
| **භාණ්ඩාගාර ප්‍රදානයන් රහිතව අතිරික්තය / (ඌණතාවය)** | | **(85,780,498)** | **(111,495,194)** |

## 2.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2023 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහන් රු. | 2022 ප්‍රතිප්‍රකාශිත රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහයන්** | | |
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය/ ඌණතාවය** | **61,799,947** | **20,680,174** |
| අරමුදල් සංචලනය සඳහා බලපෑමක් නොමැති අයිතම සඳහා ගැලපුම් | | |
| ක්ෂය කිරීම් | 30,958,260 | 34,424,870 |
| ක්‍රමක්ෂය | (17,580,445) | (22,175,368) |
| පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන්කිරීම් | 2,186,733 | 4,924,108 |
| කෙටිකාලීන තැන්පතු සඳහා පොලී | (76,601,278) | (60,316,934) |
| අවිනිශ්චිත ලැබීම් සඳහා අධි/ ඌන වෙන්කිරීම් | (846,147) | 358,811 |
| වෙනත් ආයතනයක් වෙත මාරු කළ මෝටර් රථයේ වටිනාකම | - | 875,000 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් අතිරික්තය / (ඌණතාවය)** | **(82,931)** | **(21,229,340)** |
| තොගවල අඩු වීම්/ (වැඩි වීම්) | 269,032 | (971,630) |
| ඉදිරියට කළ ගෙවීම්වල අඩුවීම් / (වැඩිවීම්) | (2,540,013) | 1,500,002 |
| කාර්ය මණ්ඩල ණය අඩුවීම්/(වැඩි වීම්) | 1,996,542 | (748,357) |
| ලැබිය යුතු ශේෂයේ අඩු වීම්/ (වැඩි වීම්) | 7,793,264 | 10,383,096 |
| ගෙවිය යුතු තැන්පතුවල වැඩි වීම්/(අඩුවීම්) | (4,993,594) | (649,595) |
| උපචිත වියදම්වල වැඩි වීම්/(අඩුවීම්) | 4,390,179 | 5,760,248 |
| අත්තිකාරම් ලැබීම් වැඩි වීම්/(අඩුවීම්) | (9,063,745) | (33,531,175) |
| ගෙවන ලද පාරිතෝෂික | (5,556,305) | (5,647,518) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(7,704,640)** | **(23,904,928)** |
| **ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| ගොඩනැගිලි වටිනාකම වැඩිවීම් | - | (1,815,446) |
| මායිම් තාප්පයේ කෙරීගෙන යමින් පවතින වැඩවල ආයෝජන | (3,798,113) | - |
| ගෘහභාණ්ඩ හා සවි කිරීම් වල වැඩිවීම් | - | (53,746) |
| කාර්යාල උපකරණ මිලදී ගැනීම | (207,639) | (12,240) |
| විදුලි උපකරණ සවි කිරීම් වල මිලදී ගැනීම් | (828,048) | (1,950,414) |
| පරිගණක මිලදී ගැනීම් | (11,459,400) | (2,812,100) |
| පොත්පත් මිලට ගැනීම | (96,921) | (93,328) |
| අනෙකුත් වත්කම්වල ආයෝජන | (458,793) | (177,664) |
| පාරිතෝෂික අරමුදල් ආයෝජනය | (6,358,901) | (3,842,081) |
| කෙටිකාලීන තැන්පතුවල පොළිය ලැබීම් | 76,601,278 | 60,316,934 |
| කෙටිකාලීන තැන්පතු ආයෝජන ඉහළට යෑම | (37,796,152) | (26,394,630) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **15,597,313** | **23,165,285** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල ප්‍රවාහය** | | |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය | - | 680,000 |
| දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථාන සමාගමෙහි ශේෂය වැඩිවීම් /(අඩුවීම්) | (1,655,059) | (1,655,059) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලැබූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(1,655,059)** | **(975,059)** |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම් /(අඩු වීම්) | 6,154,682 | (22,944,041) |
| කාල පරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ | 4,823,198 | 27,767,240 |
| **කාල පරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | **10,977,881** | **4,823,198** |

2.4 ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | පාලන අස්තිත්වයේ හිමිකරුවන් වෙත පැවරෙන | | | මුළු ශුද්ධ වත්කම් හිමිකම් |
|---|---|---|---|---|
| | දායක ප්‍රාග්ධනය | වෙනත් සංචිත | සමුච්චිත අතිරික්තය / (ඌනතාවය) | |
| | රු. | රු. | රු. | රු. |
| **2022 ජනවාරි 01 දිනට ශේෂය** | 530,983,210 | 161,121,424 | 114,985,656 | 807,090,290 |
| ගොඩනැගිලි ප්‍රත්‍යාගණනිත සංචිත | | | | - |
| වෙනත් ආයතන වලින් මාරුකළ වත්කම් | | | | - |
| වෙනත් ආයතන වලින් මාරුකළ වත්කම් | | 43,733 | | 43,733 |
| **ගිණුම්කරණ ප්‍රතිත්තියේ වෙනස්වීම** | | | | |
| ගිණුම්කරණ ප්‍රතපත්තියේ වෙනස්වීම | | | | |
| පෙර වර්ෂ ගැළපුම් | | | | - |
| ප්‍රතිප්‍රකාශිත ශේෂය | **530,983,210** | **161,165,157** | **114,985,656** | **807,134,024** |
| **2022 වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/හිමිකම්වල වෙනස** | | | | |
| භාණ්ඩාගාරයෙන් ලද දායකත්වය - ප්‍රාග්ධනය | 680,000 | | | 680,000 |
| විලම්බිත ආදායම් ක්‍රමක්ෂය | (22,175,368) | | | (22,175,368) |
| ප්‍රතිප්‍රකාශිත පරිදි පරිච්ඡේදය සඳහා අතිරික්තය/ඌනතාවය | | | 20,680,174 | 20,680,174 |
| **2022 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන ගිය ශේෂය** | **509,487,842** | **161,165,157** | **135,665,830** | **806,318,830** |
| | | | | |
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | 509,487,842 | 161,165,157 | 135,665,830 | 806,318,830 |
| ගොඩනැගිලි ප්‍රත්‍යාගණනිත සංචිත | | | | - |
| **ගිණුම්කරණ ප්‍රතපත්තියේ වෙනස්වීම** | | | | |
| ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්වීම | | | | - |
| පෙර වර්ෂ ගැළපුම් | | | | - |
| ප්‍රතිප්‍රකාශිත ශේෂය | **509,487,842** | **161,165,157** | **135,665,830** | **806,318,830** |
| **2023 වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ හිමිකම් වල වෙනස** | | | | |
| භාණ්ඩාගාරයෙන් ලද දායකත්වය - ප්‍රාග්ධනය | - | | | - |
| විලම්බිත ආදායම් ක්‍රමක්ෂය | (17,580,445) | | | (17,580,445) |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය / ඌනතාවය | | | 61,799,947 | 61,799,947 |
| **2023 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙනගිය ශේෂය,** | **491,907,397** | **161,165,157** | **197,465,777** | **850,538,331** |

## 2.5 2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

### 2.5.1. පොදු

**I. වාර්තාකරණ අස්තිත්වය**

1982 අංක 09 දරන පනතින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ස්ථාපනය කර ඇති අතර ශ්‍රී ලංකාවේ, කොළඹ 07, මලලසේකර මාවතේ, අංක 28/10 දරන ස්ථානයේ පිහිටා තිබේ. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ක්‍රියාත්මක වේ.

**II. වාර්තාකරණ කාල පරිච්ඡේදය**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ මූල්‍ය වාර්තාකරණ කාල සීමාව වනුයේ 2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා ය.

**III. මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම**

2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි පාලක මණ්ඩල කාමරයේ 2023 පෙබරවාරි 27 දින ප.ව.5.00ට පැවති රැස්වීමේ දී පාලක මණ්ඩලය විසින් අවසර ලබාදෙන ලදී.

### 2.5.2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

**I. අනුකූලතා ප්‍රකාශය**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලව ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් සමඟින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කරන ලද අතර පහත 2.5.2.II සිට 2.5.2.XIX දක්වා සඳහන් කර ඇති ප්‍රතිපත්ති යොදා ගන්නා ලදී.

**II. පිළියෙල කිරීමේ පදනම**

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, වෙනස් ආකාරයකින් සඳහන් කර නොමැති නම් උපචිත පදනමින් සහ ඓතිහාසික පිරිවැය සංකල්පය යටතේ පිළියෙළ කර තිබේ.

**III. සංසන්දනාත්මක තොරතුරු**

වෙනස් ආකාරයකින් සඳහන් කර නොමැති නම්, ආයතනය විසින් යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මීට පෙර වර්ෂයේ යොදාගත් ප්‍රතිපත්ති සමඟ අනුකූල වේ. පසුගිය වර්ෂයේ ඇස්තමේන්තු සහ වාක්‍යාංශ ප්‍රවර්තන වර්ෂයේ අවශ්‍ය අවස්ථාවන්හි දී ඉදිරිපත් කිරීම සඳහා අනුකූලවීම සඳහා නැවත සකස් කර ඇත.

**IV. ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්**

සියලු ප්‍රමාණාත්මක මූල්‍ය තත්ත්ව සංසිද්ධි සැලකිල්ලට ගෙන ඇති අතර, මූල්‍ය ප්‍රකාශවල අදාළ සටහන්වල දී යෝග්‍ය ගැලපුම් හෝ හෙළිදරව් කිරීම් සිදුකර තිබේ.

**V. ව්‍යවහාර මුදල් ඒකකය ඉදිරිපත් කිරීම**

ආයතනය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් (LKR) ආයතනයේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර තිබේ.

**VI. අඛණ්ඩ පැවැත්ම**

කළමනාකාරිත්වය විසින් සිය කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑමේ හැකියාව තක්සේරුගත කර ඇති අතර නුදුරු අනාගත කාලය තුළ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යෑම සඳහා ආයතනය සතුව ප්‍රමාණවත් සම්පත් ඇති බවට කළමනාකාරිත්වය සෑහීමට පත්වී තිබේ. තව ද, අඛණ්ඩ පැවැත්ම යටතේ ක්‍රියාත්මක වීම සඳහා ආයතනයට ඇති හැකියාව සඳහා සුවිශේෂී සැකයක් එල්ල විය හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා සම්බන්ධයෙන් කළමනාකාරිත්වයට දැනගැනීමට නොමැත. ඒ අනුව, ආයතනයේ මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩ පැවැත්ම පදනමින් අඛණ්ඩව පිළියෙල කරනු ලැබේ.

**VII. වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම**

දේපළ, පිරියත සහ උපකරණ පිරිවැය හෝ ප්‍රත්‍යාගණනය කළ වටිනාකමින්, සමුච්චිත ක්ෂය අඩුකළ පසු අගයට දැක්වේ. වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලය මුළුල්ලේ, සරල මාර්ග පදනමින් ක්ෂය කර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දැක්වේ. ඉඩමේ ඔප්පුව මේ වන තෙක් නිකුත් කර නොමැති බැවින් කොළඹ 07, 28/10, මලලසේකර මාවතේ පිහිටි ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට අයත් ඉඩමේ (ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර 1.186) වටිනාකම (රු.2,804,400,000.00) මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

- **ක්ෂය කිරීම්**

  ක්ෂය කිරීමේ අනුප්‍රමාණයන් පහත පරිදි වේ.

| වත්කම් කාණ්ඩය | අනුප්‍රමාණය |
|---|---|
| ගොඩනැගිලි | 2.5% |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 20% |
| විදුලි උපකරණ | 20% |
| පරිගණක | 20% |
| මෝටර් වාහන | 20% |
| පොත් | 10% |
| මෘදුකාංග පැකේජ | 20% |
| අනෙකුත් | 10% |

මිලදී ගනු ලබන වර්ෂය සහ අලෙවි කරන වර්ෂය තුළ, භාවිතා කරන කාල සීමාව පදනම් කරගෙන ක්ෂය කිරීම දක්වන අතර, මිලදී ගැනීම සිදුකරන මාසයේ පූර්ණ වශයෙන් ක්ෂය කරන අතර අලෙවි කරන මාසයේ දී ක්ෂය කිරීම දක්වනු නොලැබේ.

**VIII. ප්‍රත්‍යාගණනය**

වත්කමක් හදුනාගැනීමෙන් අනතුරුව, සාධාරණ අගය විශ්වාසනීය ආකාරයෙන් මැනිය හැකි දේපළ, පිරියත සහ උපකරණ පන්තිය එහි ප්‍රත්‍යාගණනිත අගයට, එනම් ප්‍රත්‍යාගණනය කළ දිනට පැවති සාධාරණ අගයෙන් පසුකාලීන සමුච්චිත ක්ෂය සහ පසුකාලීන සමුච්චිත හානිකරණ අඩුකළ අගයට වාර්තා කෙරේ. මේ අනුව ඉදිරියට ගෙන යනු ලැබේ. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ගොඩනැගිලි සහ මෝටර් වාහන පිළිවෙලින් 2021 සහ 2020 වර්ෂයේ දී ප්‍රත්‍යාගණනය කරන ලද අතර ප්‍රත්‍යාගණනිත අතිරික්තය වත්කමේ වටිනාකම ඉහල යනු ලැබූ ප්‍රමාණය දක්වා සෘජුවම ප්‍රත්‍යාගණනිත අතිරික්තයට බැර කරන ලදී.

**IX. තොග**

පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු අගයට තොග මිනුම්කරණය කෙරේ. පළමුව මිලදී ගන්නා තොග පළමුව ඉවත් කිරීම යන ප්‍රතිපත්තිය(FIFO) යටතේ තොග පිරිවැය ගණනය කරනු ලබන අතර මීට තොග අත්පත් කරගැනීමට වැයවන පිරිවැය සහ දැනට පවතින ස්ථානය සහ තත්ත්වයට ගෙන ඒමට දරන ලද අනෙකුත් පිරිවැය ද ඇතුළත් වේ.

**X. ලැබිය යුතු**

බොල් සහ අඩමාණ ණය සඳහා වෙන් කිරීම් අඩු කිරීමෙන් පසු, උපලබ්ධි වන ඇස්තමේන්තු අගයට ලැබිය යුතු දෑ සටහන් කෙරේ. ණය හිමියන් උපලබ්ධි විය යුතු අගයට සටහන් කෙරේ. පශ්චාත් උපාධි අංශය සහ භාෂා ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් අයකරගත යුතු සම්පූර්ණ ප්‍රමාණය මත පමණක් අඩමාණ ණය සඳහා වෙන් කිරීම් සිදු කෙරේ.

**XI. මුදල් සහ මුදල් සමාන දෑ**

අතැති සහ බැංකුවේ ඇති මුදල් සහ කල්පිරීම තෙක් ඇති පවත්වාගෙන යන කෙටි කාලීන තැන්පතු පිරිවැයට හිණුම්ගත කෙරේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා, මුදල් සහ මුදල් සමාන දෑ යනු අතැති මුදල් සහ බැංකුවල ඇති තැන්පතු වේ.

### XII. වගකීම් සහ වෙන් කිරීම්

සියලු පිළිගත් වගකීම් මුදල් ප්‍රකාශ පිළියෙල කිරීමේ දී සැලකිල්ලට ගනී.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සහ දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය (Distance Learning Centre Ltd) අතර 2003.02.16 දිනැතිව අත්සන් තබන ලද ගිවිසුම ප්‍රකාරව, දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් 4 වැනි මහලේ ඉදිකිරීමේ වියදම ලෙස රු.49,651,765/-ක මුදලක් ආයෝජනය කර ඇති අතර, එම අගය වසර 30කින් ක්‍රමක්ෂය කෙරේ. එහි ශේෂය ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇත.

### XIII. සේවක ප්‍රතිලාභ

සියලුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලින් ආවරණය වේ. සාමාන්‍යයෙන් පවතින සුබ සාධක පහසුකම්වලට අමතරව අනුමත වෛද්‍ය යෝජනා ක්‍රමයක් සලසා ඇත. සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ආයතනය විසින් ලබාදෙන දායකත්වය පිළිවෙලින් 15% සහ 3% කි.

- **පාරිතෝෂික**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනයට යම් සේවකයකු හෝ සේවකයන් පාරිතෝෂික ගෙවීම පිළිබඳ පනතේ ප්‍රතිපාදන යටතේ පාරිතෝෂික ගෙවීම් ලබාගැනීමට සුදුසුකම් නොලැබුව ද, සියලුම සේවකයන් එම ගෙවීම ලබාගැනීම සඳහා සුදුසුකම් ලබන බවට යන උපකල්පනය යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ දිනයට එම සියලු සේවකයන් විශ්‍රාම යනු ලබන බවට යන පදනමින්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම පිළිබඳ පනත යටතේ විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් වේ. 2013 ජනවාරි 24 දිනැතිව පාලක සභාවේ විසින් එළඹි යෝජනා සම්මතය පරිදි, 2014 සිට ඉදිරියට පාරිතෝෂික ගෙවීම් සඳහා දිගු කාලීන ආයෝජන පවත්වා ගනී.

### XIV. රජයේ ප්‍රදාන සහ සහනාධාර

ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරයෙන් ලද පුනරාවර්තන ප්‍රදාන අදාළ පිරිවැය හඳුනාගන්නා කාලසීමාව තුළ ආදායමක් ලෙස හඳුනාගනී.

2013 වර්ෂයේ සිට ඉදිරියට, මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදානය විලම්බිත ආදායමක් ලෙස හඳුනාගත් අතර වත්කම් අත්පත් කරගැනීම සඳහා උපයෝගී කරගන්නා ප්‍රාග්ධන ප්‍රදානය පසුකාලීන කාලසීමා තුළදී වැයකරන අතර LKAS 20 ප්‍රකාරව විලම්බිත ආදායමක් ලෙස හඳුනාගනී. මුදල් හා මුදල් සමාන දෑ ඇතුළුව අනෙකුත් වත්කම් වලින් නියෝජනය වන රජයේ ප්‍රදානවලින් වගකීම් අඩුකිරීමෙන් අනතුරුව (ලැබුණ ප්‍රදානය මත වන වගකීම් හැර) වගකීම් ලෙස හඳුනාගනී.

වර්ෂය අවසානයේ ප්‍රාග්ධන ප්‍රදානයේ ශේෂය ඊළඟ වර්ෂය වෙත ගෙන යන අතර අවශ්‍ය විට උපයෝගී කරගනී.

### XV. ප්‍රතිපාදන සහ අසම්භාව්‍ය වගකීම්

සම්පත් බාහිරයට ගලා යෑමේ ප්‍රතිඵල වන බැඳීමක් සහ විශ්වාසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කරගත හැකි මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනයට පවතින සියලු බැඳීම් සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන සහ භාෂා මධ්‍යස්ථානයට අදාළ අවිනිශ්චිත ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදන වසර අවසාන ශේෂයෙන් 10%ක් ලෙස වෙන් කෙරේ.

### XVI. ආදායම් හඳුනාගැනීම

ආයතනය තුළට ආර්ථික ප්‍රතිලාභ ගලා එන බවට සම්භාවිතාවයක් ඇති ප්‍රමාණය දක්වා සහ දරා ඇති හෝ දැරීමට ඇති ආදායම් හා බැඳි පිරිවැය විශ්වාසනීය අයුරින් මැනීමට හැකිනම් පමණක් ආදායම් හඳුනාගනී. ලැබී ඇති හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවල සාධාරණ අගය මත ආදායම් මිනුම්කරණය කෙරේ.

ආදායම හඳුනාගැනීම සඳහා පහත දැක්වෙන විශේෂිත නිර්ණායක යොදා ගැනේ.

(අ) පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති ප්‍රදාන එකී වර්ෂය සඳහා ආදායම් ලෙස හඳුනාගැනේ.

(ආ) සේවාදායක නියෝජිත ආයතනවලින් උපදේශකත්ව පැවරුම් සඳහා මුලින් ලැබෙන අරමුදල් ඒවා උපයෝජනය කරන තුරු වගකීමක් ලෙස හඳුනාගැනේ. කාර්යසාධනයේ සමානුපාතය මත පදනම්ව අරමුදල් ආදායමක් ලෙස හඳුනාගැනේ.

(ඇ) පුහුණු පාඨමාලා, කුලී සහ අනෙකුත් දෑ වලින් ලැබෙන ආදායම උපචිත පදනමින් හඳුනාගනී.

(ඈ) සේවාරාම්භක පුහුණු වැඩසටහන්වලින් ලැබෙන ආදායම 2012 වර්ෂයේ සිට ඉදිරියට උපදේශකත්ව ආදායම් ලෙස වර්ගීකරණය කෙරේ.

**XVII. වියදම් හඳුනාගැනීම**

දරන ලද පිරිවැය සහ ආදායම් සුවිශේෂී අයිතමවලින් ඉපැයුම් අතර සෘජු සබඳතාවය පදනමින් වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. ආයතනය පවත්වාගෙන යෑම සහ කාර්යක්ෂම ආකාරයකින් දේපළ, පිරියත සහ උපකරණ පවත්වාගෙන යෑම සඳහා දරන සියලු වියදම්, ශුද්ධ අතිරික්තය හෝ ඌනතාවය ගණනය සඳහා ආදායමින් අයකරනු ලැබේ.

**XVIII. නේවාසිකාගාර කටයුතු**

2012 වර්ෂයේ සිට ඉදිරියට, නේවාසිකාගාර කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල වෙනම අයිතමයක් වශයෙන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඉදිරිපත් කර නොමැත. එසේ වුව ද, නේවාසිකාගාර ආදායම් සහ වියදම්වල විස්තර අදාළ සටහන් වල දී වෙන්ව සඳහන් කර ඇත.

**IX. අයවැය ඉදිරිපත් කිරීම**

2023 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් අනුව ආයතනයේ අයවැය සකස් කරන ලදී. අයවැය සහ තත්‍ය අගයන් අතර සංසන්දනාත්මක ප්‍රකාශය 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල පිටු අංක 22 සිට 23 දක්වා දැක්වේ.

# පාලක සභාවේ සාමාජිකයන්

# 03

1982 අංක 09 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පනතේ 6 (1) වගන්තිය ප්‍රකාරව, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන ගරු අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා පාලක සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් පත්කරන ලදී.

**කේ.ඩී.එන්. රංජිත් අසෝක මහතා**
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
*පාලක සභාවේ සභාපති*

........................................................................

**එම්.එන්.රණසිංහ මහතා**
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
*සාමාජික*

........................................................................

**සුමිත් අබේසිංහ මහතා**
සභාපති
මුදල් කොමිෂන් සභාව
*සාමාජික*

........................................................................

**මහාචාර්ය චමින්ද රත්නායක මහතා**
නියෝජ්‍ය උපකුලපති
එන් එස් බී එම් හරිත විශ්වවිද්‍යාලය
*සාමාජික*

........................................................................

**සුපුන් වීරසිංහ මහතා**
අධ්‍යක්ෂ/ සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී
ඩයලොග් ආසියාටා පුද්ගලික සමාගම
*සාමාජික*

........................................................................

**ජුඩ් නිලුක්ෂාන් මහතා**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අයවැය දෙපාර්තමේන්තුව
*විකල්පීය සාමාජික*

........................................................................

**වී. ජෙගරාසසිංහම් මිය**
*සාමාජික*

........................................................................

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය හා අධ්‍යයනේන්ද්‍රිය කාර්ය මණ්ඩලය

# 04



**නාලක කලුවැව මහතා**
ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය)

**අධ්‍යක්ෂ ජනරාල්**

- ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ආචාර්ය උපාධිය ලබාගැනීමේ අධ්‍යයන කටයුතුවල නියැලෙමින් සිටී (කොළඹ විශ්වවිද්‍යාලය)
- රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (කැන්බරා විශ්වවිද්‍යාලය)
- කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය (කැන්බරා විශ්වවිද්‍යාලය)
- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (කොළඹ විශ්වවිද්‍යාලය)
- ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කොළඹ විශ්වවිද්‍යාලය)
- උද්භිද විද්‍යාව සහ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**

- ව්‍යාපාර පරිපාලනය
- රාජ්‍ය පරිපාලනය
- කළමනාකරණය
- අන්තර් විෂයය කළමනාකරණය



**එච්.එම්.එස්.පී.තිසේරා මිය**
ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය)

**අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්)**

- රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ පශ්චාත් උපාධිය (GRIPS - ජපානය)
- කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (රජරට විශ්වවිද්‍යාලය)
- ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය (කොළඹ විශ්වවිද්‍යාලය)

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**

- ශ්‍රමික සංක්‍රමණය
- ප්‍රසම්පාදන කටයුතු
- මානව සම්පත් කළමනාකරණය



**ආචාර්ය ඩබ්.එම්.එම්.ජී.ඩී.විජේකෝන් මහතා**
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන/ කළමනාකරණ නොවන පුහුණු)

- ව්‍යාපෘති අවදානම් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය (කොළඹ විශ්වවිද්‍යාලය )
- නාගරික පරිසර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (AIT, බැංකොක්, තායිලන්තය)
- භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය (කොළඹ විශ්වවිද්‍යාලය )

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**

- පර්යේෂණ ක්‍රමවේද
- ව්‍යාපෘති කළමනාකරණය
- පුහුණුකරුවන් පුහුණුකිරීම (TOT)



**එන්.ජේ.ජයසුන්දර මිය**
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ආයතනික සංවර්ධන)

- පාරිසරික ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය (කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)
- පාරිසරික කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකය (CDG, ජර්මනිය)
- විද්‍යාවේදී කෘෂිකර්ම (ගෞරව) උපාධිය (පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**
- පාරිසරික කළමනාකරණය
- තිරසර සංවර්ධනය
- ආපදා අවදානම් කළමනාකරණය
- ව්‍යාපෘති සැලසුම්කරණය
- පුහුණුකරුවන් පුහුණුකිරීම (TOT)

---



**ඒ.වී. ජනාදර මහතා**
ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වැ.බ. (පශ්චාත් උපාධි අධ්‍යයන)

- රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (ෆ්ලින්ඩර්ස් විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව)
- රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)
- ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කොළඹ විශ්වවිද්‍යාලය)
- වාණිජවේදී (විශේෂ) උපාධිය (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)
- නීතිඥවරයෙකි

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**
- පරිපාලන නීතිය
- සංවර්ධන ආර්ථික විද්‍යාව
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

---



**අනූෂා බටවල ගමගේ මිය**
ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉගෙනුම් සහ සංවර්ධන)

- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය සඳහා නිපුණතාවය ලද අපේක්ෂකයෙකි (කොළඹ විශ්වවිද්‍යාලය)
- ස්ත්‍රී/පුරුෂ සමාජ භාවය හා සංවර්ධන අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධිය (මෙල්බන් විශ්වවිද්‍යාලය - ඕස්ට්‍රේලියාව)
- රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය)
- ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනයේ වරලත් සාමාජිකාවකි
- සත්ත්ව විද්‍යාව හා රසායන විද්‍යාව සමඟ උද්භිද විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) විශේෂ උපාධිය (කොළඹ විශ්වවිද්‍යාලය)

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**
- මානව සම්පත් කළමනාකරණය
- ස්ත්‍රී/පුරුෂ සමාජ භාවය හා සංවර්ධනය
- නායකත්වය, කණ්ඩායම් හැඟීම් ගොඩනැංවීම සහ මනෝවිද්‍යා සහ සමාජීය නිපුණතා සංවර්ධනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණුකිරීම
- සහතිකලාභී ප්‍රධාන පුහුණුකරුවෙකි (සිවිල් සේවා විදුහල- සිංගප්පූරුව)



**සමන්ති සේනානායක මෙය**
ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය)

**ජ්‍යෙෂ්ඨ උපදේශක**
- තොරතුරු පද්ධති පිළිබඳ පශ්චාත් උපාධිය (මෙල්බර්න් විශ්වවිද්‍යාලය)
- තොරතුරු කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (SLIIT)
- විද්‍යාවේදී උපාධිය (ක්ෂුද්‍ර ජීවී විද්‍යාව, රසායන විද්‍යාව)

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**
- ඩිජිටල් පරිවර්තනය
- ඩිජිටල් පාලනය
- නවෝත්පාදන සහ ඩිජිටල් සංවර්ධනය
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය



**ජේ.ජයසුන්දර මහතා**
ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය)

**ජ්‍යෙෂ්ඨ උපදේශක**
- රාජ්‍ය ප්‍රතිපත්තිය සහ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය (මෙල්බන් විශ්වවිද්‍යාලය)
- රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)
- වාග් විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය (කැළණිය විශ්වවිද්‍යාලය)
- ශාස්ත්‍රවේදී උපාධිය (කැළණිය විශ්වවිද්‍යාලය)

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**
- රාජ්‍ය ප්‍රතිපත්තිය
- ඉංග්‍රීසි භාෂාව
- නායකත්ව අධ්‍යයන
- මානව සම්පත් කළමනාකරණය



**ආර්.රුෂාන්දන් මහතා**
ශ්‍රී ලංකා පරිපාලන සේවය (I ශ්‍රේණිය)

**ජ්‍යෙෂ්ඨ උපදේශක**
- සංවර්ධන අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධිය (මෙල්බන් විශ්වවිද්‍යාලය)
- සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MKU, ඉන්දියාව)
- දරිද්‍රතාවය පිටුදැකීමේ උපායමාර්ග පිළිබඳ පශ්චාත් උපාධි සහතිකය (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය)
- පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය (පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**
- කළමනාකරණය
- රාජ්‍ය පරිපාලනය
- ආයතන සංග්‍රහය
- මානව හැසිරීම



**කේ.ආර්.ගංගාධර මහතා**
ශ්‍රී ලංකා පරිපාලන සේවය (I ශ්‍රේණිය)

**ජ්‍යෙෂ්ඨ උපදේශක**
- ජාත්‍යන්තර හා සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය (ඕස්ට්‍රේලියා ජාතික විශ්වවිද්‍යාලය)
- ජාත්‍යන්තර හා සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධි ඩිප්ලෝමාව (ඕස්ට්‍රේලියා ජාතික විශ්වවිද්‍යාලය)
- භූ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**
- ආර්ථික සංවර්ධනය සහ ආර්ථික ප්‍රතිපත්තිය
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය
- තිරසර සංවර්ධනය
- රාජ්‍ය පරිපාලනය



**එල්.ගමගේ මහතා**
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (I ශ්‍රේණිය)

**ජ්‍යෙෂ්ඨ උපදේශක**
- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (රජරට විශ්වවිද්‍යාලය)
- ගිණුම්කරණය, මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**
- රජයේ ප්‍රසම්පාදන කටයුතු
- ක්‍රමෝපායික කළමනාකරණය
- රාජ්‍ය මූල්‍ය
- සැපයුම්දාම කළමනාකරණය



**සී.ඩබ්.කේ.කුරුප්පු ආරච්චි මහතා**
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (I ශ්‍රේණිය)

**ජ්‍යෙෂ්ඨ උපදේශක**
- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (ජාත්‍යන්තර විශ්වවිද්‍යාලය ජපානය)
- ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය (කැළණිය විශ්වවිද්‍යාලය)
- ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය - මූල්‍ය (විශේෂ)

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**
- රාජ්‍ය මූල්‍ය
- දත්ත කළමනාකරණය
- ප්‍රසම්පාදන කටයුතු
- බදුකරණය



**එන්.ගෞරිදාසන් මහතා**
ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය (II ශ්‍රේණිය)

**උපදේශක**

- ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධිය (ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව)
- පාරිසරික ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය (කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)
- e-රාජ්‍යය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- විද්‍යාවේදී කෘෂිකර්ම (ගෞරව) උපාධිය (නැගෙනහිර විශ්වවිද්‍යාලය)

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**

- ව්‍යාපෘති කළමනාකරණය
- පාරිසරික කළමනාකරණය
- ආර්ථික විද්‍යාව
- දූෂණ විරෝධය

---



**ආර්.එම්.ඒ.රත්නායක මෙය**
ශ්‍රී ලංකා පරිපාලන සේවය (III ශ්‍රේණිය)

**සහාය උපදේශක/ සහකාර අධ්‍යක්ෂ වැ.බ.(විභාග)**

- රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය (කොළඹ විශ්වවිද්‍යාලය)
- නීතිවේදී උපාධිය (ලන්ඩන්) (University of London International Programmes)
- වාණිජවේදී උපාධිය (විශේෂ) (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)
- නීතිඥවරියකි

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**

- නීතිය
- රාජ්‍ය පරිපාලනය
- ක්‍රමෝපායික කළමනාකරණය
- විශ්‍රාමික ප්‍රතිලාභ

---

**පී.පී.ඒ.බෝපගමගේ මිය (2023.06.16 දක්වා)**
ශ්‍රී ලංකා පරිපාලන සේවය (III ශ්‍රේණිය)

**සහාය උපදේශක**

- ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (කොළඹ විශ්වවිද්‍යාලය)
- විද්‍යාවේදී (භෞතික විද්‍යා) උපාධිය( ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)
- රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව (SLIDA)
- ජාත්‍යන්තර සබඳතා පිළිබඳ උසස් ඩිප්ලෝමාව (ජාත්‍යන්තර සබඳතා පිළිබඳ බණ්ඩාරනායක කේන්ද්‍රය)
- රාජ්‍ය තාන්ත්‍රික හා ගෝලීය කටයුතු පිළිබඳ ඩිප්ලෝමාව (බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රික පුහුණු ආයතනය)

# සේවා පහසුකම් සපයන්නන්ගේ තොරතුරු

# 05



**කේ. අරුණු ප්‍රභා පෙරේරා මිය**
ශ්‍රී ලංකා පරිපාලන සේවය (I ශ්‍රේණිය)

**අධ්‍යක්ෂ (පාලන)**

- සංවර්ධන අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධිය (කොළඹ විශ්වවිද්‍යාලය)
- සංවර්ධන අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කොළඹ විශ්වවිද්‍යාලය)
- අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කොළඹ විශ්වවිද්‍යාලය)
- විද්‍යාවේදී උපාධිය (කොළඹ විශ්වවිද්‍යාලය)

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**

- රාජ්‍ය පරිපාලනය
- රාජ්‍ය ප්‍රතිපත්තිය
- මානව සම්පත් කළමනාකරණය
- ව්‍යාපෘති සැලසුම්කරණය



**ඩබ්.ඒ.කේ.එස්. ද අල්විස් මහතා**
ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය (I ශ්‍රේණිය)

**අධ්‍යක්ෂ (මුදල්)**

- රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ පශ්චාත් උපාධිය (මූල්‍ය), KDI, දකුණු කොරියාව
- වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී (CPFA) (ශ්‍රී ලංකාව)
- රාජ්‍ය මූල්‍ය හා ගණකාධිකරණ ආයතනය (එක්සත් රාජධානිය)
- විද්‍යාවේදී (ගිණුම්කරණ) විශේෂ උපාධිය (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**

- මූල්‍ය කළමනාකරණය
- භාණ්ඩාගාර ගිණුම්
- CIGAS සහ රජයේ වැටුප් සැකසීමේ පද්ධතිය
- විදේශ තානාපති කාර්යාලවල ගිණුම්
- අත්තිකාරම් ගිණුම්



**ඩී.කේ.ආර්.ඒ.ධර්මසේන මහතා**
ශ්‍රී ලංකා පරිපාලන සේවය (I ශ්‍රේණිය)

**අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ හා වැඩසටහන් ප්‍රවර්ධන)**

- තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිය (මෙල්බන් විශ්වවිද්‍යාලය)
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විද්‍යාවේදී උපාධිය (කොළඹ විශ්වවිද්‍යාලය)

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**

- ආයතනික යෙදවුම් සහ නිර්මිත
- තොරතුරු තාක්ෂණ සේවා කළමනාකරණය
- සයිබර් ආරක්ෂාව කළමනාකරණය
- තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති සහ ආයතනික අරමුණු, ක්‍රියාවලි හා තාක්ෂණ පරිණාමනය කළමනකාරණය (Change Management)



**කේ.එල්.එම්.සී. කුලරත්න මිය**
ශ්‍රී ලංකා පරිපාලන සේවය (I ශ්‍රේණිය)

**ලේඛකාධිකාරී**
- රාජ්‍ය ප්‍රතිපත්තිය සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (මොනෑෂ් විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව)
- පාරිසරික වන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය (කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය)
- විද්‍යාවේදී කෘෂිකර්ම (විශේෂ) උපාධිය (පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**
- රාජ්‍ය ප්‍රතිපත්තිය
- පාරිසරික කළමනාකරණය
- ක්‍රමෝපායික කළමනාකරණය
- විනය කාර්ය පටිපාටි



**ටී.ඩී. නාරංගොඩ මිය**
අභ්‍යන්තර විගණක

- ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (කැළණිය විශ්වවිද්‍යාලය)
- ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය)
- ව්‍යාපාර පරිපාලන වාණිජවේදී උපාධිය, මානව සම්පත් (ගෞරව) උපාධිය (කැළණිය විශ්වවිද්‍යාලය)
- වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී (වරලත් ගණකාධිකාරී ආයතනය - ශ්‍රී ලංකාව)

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**
- විගණනය
- ගිණුම්කරණය
- ප්‍රසම්පාදනය
- මානව සම්පත් කළමනාකරණය



**එස්.එල්. ඉන්දු සමරවික්‍රම මිය**
සහකාර ලේඛකාධිකාරී

- ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (කැළණිය විශ්වවිද්‍යාලය)
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය (කැළණිය විශ්වවිද්‍යාලය)

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**
- මානව සම්පත් කළමනාකරණය
- ආර්ථික විද්‍යාව



**බී.ඒ. ප්‍රියානි බාලසූරිය මිය**


**පුස්තකාලයාධිපති**
- පුස්තකාල හා තොරතුරු විද්‍යා පශ්චාත් උපාධිය (කැළණිය විශ්වවිද්‍යාලය)
- සිංහල විෂයය පිළිබඳ පශ්චාත් උපාධිය (පේරාදෙණිය විශ්වවිද්‍යාලය)
- අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පේරාදෙණිය විශ්වවිද්‍යාලය)
- වරලත් පුස්තකාලාධිපතිනි

**විශේෂඥතාවය දක්වන ක්ෂේත්‍ර**
- පුස්තකාල සහ තොරතුරු විද්‍යාව
- අධ්‍යාපනය
- ජනමාධ්‍ය සහ සන්නිවේදන
- පර්යේෂණ


# 06

# ක්‍රියාකාරී සහ ආයතනික ව්‍යුහය

## ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ක්‍රියාකාරී ව්‍යුහය



# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ආයතනික ව්‍යුහය



# ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් - 2023

# 07

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සියලුම ඉගෙනුම් හා සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධානතම අංශය වනුයේ ඉගෙනුම් හා සංවර්ධන අංශයයි. රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ඉගෙනුම් හා සංවර්ධන සේවා අවශ්‍යතාවයන් මෙම අංශය මගින් සපයයි. මෙම කාර්යය සඳහා, රාජ්‍ය අංශය තුළ වෙනස්වන නිපුණතා වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කිරීමට හැකියාව ලබාදෙන සැලැස්මක් මෙම අංශය සතු වේ.

රාජ්‍ය අංශයේ ආයතනවල හා ඒවායේ කළමනාකරණ මට්ටමේ කාර්ය මණ්ඩලවල හැකියාවන් ගොඩනැංවීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පහත ක්‍රියාකාරකම් දියත් කරනු ලැබේ.

1. පහත සඳහන් දීප ව්‍යාප්ත සේවා සඳහා අලුතින් බඳවාගනු ලබන තැනැත්තන් සඳහා, අදාළ සේවා ව්‍යවස්ථාවන්ට අනුකූලව සේවාරම්භක පුහුණු පැවැත්වීම (ගාස්තු අය නොකරන වැඩසටහන්)

    i. ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී ලං.ප.සේ.)
    ii. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (ශ්‍රී ලං.ග.සේ.)
    iii. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය (ශ්‍රී ලං.ක්‍ර.සේ.)
    iv. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය (ශ්‍රී ලං.වි.සේ.)
    v. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය (ශ්‍රී ලං.වා.වි.සේ)
    vi. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය (ශ්‍රී ලං.ඉං.සේ.)
    vii. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය (ශ්‍රී ලං.තො.ස.තා.සේ.)

2. දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන් සඳහා ඔවුන්ගේ I හා III වන ශ්‍රේණි මට්ටම්වල දී අනිවාර්ය ධාරිතා සංවර්ධන වැඩසටහන් (ගාස්තු අය නොකරන වැඩසටහන්)

3. කෙටිකාලීන පුහුණු වැඩසටහන් (ගාස්තු අය නොකරන වැඩසටහන්)

4. ඩිප්ලෝමා වැඩසටහන් (ගාස්තු අය කරන)

5. රාජ්‍ය අංශයේ ආයතන හා රාජ්‍ය ව්‍යවසායන් විසින් සිදුකරන ඉල්ලීම් මත පදනම්ව, එකී ආයතනික ඉල්ලීම් වලට අනුකූලව අවශ්‍යතානුකූලව සකස් කරන පුහුණු වැඩසටහන් (ගාස්තු අය කරන)

### 7.1 සේවාරම්භක පුහුණු වැඩසටහන්

සිය අදාළ සේවාවන්වල ඉදිරිපෙළ ක්‍රියාකාරීන් ලෙස කටයුතු කිරීමට හැකිවන පරිද්දෙන් පුළුල් පරාසයක විෂය කරුණු පිරිනැමීමට හා අවශ්‍ය දැනුම, නිපුණතා හා ආකල්ප ලබාදීම සඳහා දීප ව්‍යාප්ත සේවා සඳහා බඳවා ගනු ලබන නවක නිලධාරීන් වෙනුවෙන් සේවාරම්භක පුහුණු පවත්වනු ලැබේ.

මෙම වර්ෂය තුළ දී, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් නිලධාරීන් 246 දෙනෙකු සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන් පහක් (05) ක් පවත්වා ඇති අතර, එහි විස්තර පහත ඉදිරිපත් කෙරේ.

| අනු අංකය | සේවය | සහභාගී වූ සංඛ්‍යාව | ප්‍රගතිය |
|---|---|---|---|
| 01. | කළමනාකරණ සේවා නිලධාරීන් (අධි පන්තිය) සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන | 162 | අවසන් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| 02. | ශ්‍රී ලංකා පරිපාලන සේවය සඳහා කුසලතා පදනම මත බඳවාගත් කණ්ඩායම සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන | 12 | අවසන් කර ඇත. |
| 03. | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ II වැනි පන්තිය - II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන | 26 | අවසන් කර ඇත. |
| 04. | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I වැනි පන්තිය - III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන | 46 | අවසන් කර ඇත. |
| | **එකතුව** | **246** | |

### 7.2 දීප ව්‍යාප්ත සේවාවන් සඳහා අනිවාර්යය ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන්

දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය උදෙසා අවශ්‍ය වන දැනුම, කුසලතා සහ ආකල්ප අඛණ්ඩව පෝෂණය හා වැඩිදියුණු කිරීම සිය ප්‍රධානතම වගකීම්වලින් එකක් බව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් හඳුනාගෙන තිබේ.

දීප ව්‍යාප්ත සේවාවන්හි සේවා ව්‍යවස්ථා අනුව, මෙම සේවාවල නිලධාරීන් විසින් සේවාරම්භක පුහුණුව හා ධාරිතා සංවර්ධන වැඩසටහන් සම්පූර්ණ කිරීම අනිවාර්ය අවශ්‍යතාවයකි.

එබැවින්, කාර්යක්ෂම හා ඵලදායි රාජ්‍ය සේවයක් තහවුරු කිරීම සඳහා මෙම නිලධාරීන් අතර අඛණ්ඩ ඉගෙනුම් සංස්කෘතියක් පෝෂණය කිරීම ප්‍රමුඛ වශයෙන්ම වැදගත් වේ. ඒ අනුව, දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන් වෙනුවෙන්ම පහත සංකල්ප මත පදනම්ව මෙම වැඩසටහන් පවත්වනු ලැබේ:

- කලින් කලට පැන නඟින, විශේෂයෙන් හඳුනාගත් චර්යාත්මක හා තාක්ෂණික නිපුණතාවයන් වැඩිදියුණු කිරීම

- සීඝ්‍රයෙන් වෙනස් වන්නා වූ පරිසරයක නිරන්තරයෙන් ඉහළ යමින් පවතින අභියෝගවලට මුහුණු දීමට අවශ්‍ය වන්නා වූ දැනුම හා කුසලතා අඛණ්ඩව යාවත්කාලීන කිරීම හා වැඩිදියුණු කිරීම.

  ඒ අනුව, 2023 වර්ෂය තුළ මෙම ආයතනය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් 510 දෙනෙකු සඳහා ඔවුන්ගේ වෘත්තීය කාලසීමාව තුළ සිදුකළ යුතු ධාරිතා සංවර්ධන වැඩසටහන් (Mid-career Capacity Building Programmes) පවත්වන ලදී (ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ).

| අනු අංකය | සේවය | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගීවූ සංඛ්‍යාව | ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා පරිපාලන සේවය (I වන ශ්‍රේණිය) | 02 | 78 | අවසන් කර ඇත. |
| 2. | ශ්‍රී ලංකා පරිපාලන සේවය (III වන ශ්‍රේණිය) | 06 | 193 | 02 - අවසන් කර ඇත.<br>04 - ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 3. | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (I වන ශ්‍රේණිය) | 01 | 39 | අවසන් කර ඇත. |
| 4. | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (III වන ශ්‍රේණිය) | 05 | 200 | ක්‍රියාත්මක වෙමින් පවතී. |
| | **එකතුව** | **14** | **510** | |



ශ්‍රී ලං.ප.සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - C කාණ්ඩය (2015 කණ්ඩායම)



ශ්‍රී ලං.ග.සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - D කාණ්ඩය (2015 කණ්ඩායම)




ශ්‍රී ලං.ග.සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - C කාණ්ඩය (2015 කණ්ඩායම)



ශ්‍රී ලං.ග.සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - E කාණ්ඩය (2015 කණ්ඩායම)

### 7.3 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පවත්වන ලද ධාරිතා සංවර්ධන වැඩසටහන

2023 වර්ෂයේ දී මෙම ආයතනය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් 31 දෙනෙකු සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහනක් පවත්වන ලදී. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අනු අංකය | සේවය | සහභාගී වූ සංඛ්‍යාව | ප්‍රගතිය |
|---|---|---|---|
| 1. | විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන | 31 | අවසන් කර ඇත. |

### 7.4 කෙටි කාලීන පුහුණු වැඩසටහන්

සමාලෝචිත වර්ෂය තුළ දී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් කෙටිකාලීන පුහුණු වැඩසටහන් දාහතක් (17) පවත්වා ඇති අතර එහිදී නිලධාරීන් 458 දෙනෙකු පුහුණු කර ඇත.






සාමාන්‍ය හැසිරීම සහ විනය කාර්ය පටිපාටිය පිළිබඳ වැඩමුළුව

## 7.5 ඩිප්ලෝමා වැඩසටහන්

රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය (HNDIPPCA), කාර්යාල කළමනාකරණය (DOM) සහ අභ්‍යන්තර විගණනය යන ක්ෂේත්‍රවලට අදාළව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ඩිප්ලෝමා වැඩසටහන් පවත්වනු ලැබේ. මෙම ඩිප්ලෝමා වැඩසටහන් ඉතාමත් ජනප්‍රිය අතර රාජ්‍ය අංශයේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම උදෙසා වටිනා දායකත්වයක් ලබාදී තිබේ.

2023 වර්ෂය තුළ දී පහත දැක්වෙන ඩිප්ලෝමා වැඩසටහන් පවත්වා ඇත.

| අනු අංකය | වැඩසටහනේ නම | සහභාගී වූ සංඛ්‍යාව | ප්‍රගතිය |
|---|---|---|---|
| 1. | රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව - (සති අන්තයේ පැවැත්වෙන) (2022/23) | 12 | ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 2. | රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව - (සතියේ දිනවල පැවැත්වෙන) (2022/23) | 50 | ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 3. | රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව - (සති අන්තයේ පැවැත්වෙන) (2023/24) | 25 | ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 4. | රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව - (සතියේ දිනවල පැවැත්වෙන) (2023/24) | 55 | ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 5. | කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව | 36 | අවසන් කර ඇත. |
| | **එකතුව** | **178** | |

## 7.6 ආයතනික ඉල්ලීම් ප්‍රකාරව අවශ්‍යතානුකූලව සකස් කරන ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන්

සේවාලාභී ආයතන විසින් සිදුකරනු ලබන ඉල්ලීම් අනුව, ඒවාට යෝග්‍ය වන ආකාරයෙන් මෙම වැඩසටහන් විශේෂයෙන් සකස් කරනු ලැබේ. රාජ්‍ය අංශයේ ආයතනවල ඉල්ලීම් පරිදි, 2023 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් මෙවැනි පුහුණු වැඩසටහන් 20ක් පැවැත්වූ අතර නිලධාරීන් 823ක් පුහුණු කර ඇත. මෙසේ, එක් එක් ආයතනවල අවශ්‍යතානුකූලව 2023 වර්ෂය තුළ දී පහත වැඩසටහන් පවත්වා තිබේ.

| අනු අංකය | සේවාලාභී ආයතනය | අවශ්‍යතානුකූල පුහුණුව අදාළ වන ක්ෂේත්‍රය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා තක්සේරු සේවයේ I පන්තිය I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පුහුණුව | 08 |
| 2. | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ආසියා සහ පැසිෆික් පුහුණු මධ්‍යස්ථානය (APCICT) | ආපදා අවදානම් කළමනාකරණය සඳහා ඩිජිටල් තාක්ෂණය සම්බන්ධයෙන් පුහුණුව | 84 |
| 3. | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | අනුක්‍රම සැලැස්ම - 2023 සකස් කිරීම | 31 |
| 4. | අධ්‍යාපන දෙපාර්තමේන්තුව - දකුණු පළාත | කලාපීය අධ්‍යක්ෂවරු සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 40 |
| 5. | ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් | SLIDA Computer Driving Licence සහතික පත්‍ර පාඨමාලාව සඳහා පුහුණු වැඩසටහන | 72 |
| 6. | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | සේවක පඩි ලැයිස්තු සකස් කිරීම | 30 |
| 7. | ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් | පරිගණක පුහුණු වැඩසටහන | 48 |
| 8. | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ වැඩමුළුව | 70 |
| 9. | ජාතික පොලිස් අභ්‍යාස ආයතනය | ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සඳහා කළමනාකරණ සහ සංවර්ධන පුහුණු වැඩසටහන | 34 |
| 10. | ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව | කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණ පාඨමාලාව | 10 |
| 11. | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම | 80 |
| 12. | අධ්‍යාපන අමාත්‍යාංශය | ජාතික විද්‍යා පිඨවල පීඨාධිපතිවරු, උප පීඨාධිපතිවරු සඳහා පුහුණු වැඩසටහන් (1 වැනි කණ්ඩායම) | 35 |
| 13. | අධ්‍යාපන අමාත්‍යාංශය | ජාතික විද්‍යා පිඨවල පීඨාධිපතිවරු, උප පීඨාධිපතිවරු සඳහා පුහුණු වැඩසටහන් (2 වැනි කණ්ඩායම) | 40 |
| 14. | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - පළාත් සභා සහ පළාත් පාලන අංශය | මූලික ප්‍රසම්පාදන කටයුතු සහ යොමු කිරීමේ අනුදේශ හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා සකස් කිරීම පිළිබඳ පුහුණුව | 40 |
| 15. | විදේශ රැකියා නියුක්ත කාර්යාංශය (SLBFE) | විදේශ රැකියා නියුක්ත කාර්යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන | 10 |
| 16. | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | ආයතන සංග්‍රහය සහ කාර්යාල කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | 100 |

| | | | |
|---|---|---|---|
| 17. | කම්කරු දෙපාර්තමේන්තුව | අලුතින් බඳවාගත් සහකාර කම්කරු කොමසාරිස්වරුන් සඳහා පුහුණු වැඩසටහන | 17 |
| 18. | ජාතික පොලිස් කොමිෂන් සභාව | කාර්යාල පද්ධති සහ ගොනු කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 61 |
| 19. | අධ්‍යාපන අමාත්‍යාංශය | ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවල දේශකයන් සඳහා පුහුණු වැඩසටහන | 37 |
| | **එකතුව** | | **847** |

### 7.7 2023 වර්ෂයේ නව්‍ය ප්‍රවේශය 2023

ධාරිතා සංවර්ධන වැඩසටහන්වල සහභාගිකයන් සමඟ සහයෝගීතාවයෙන් වර්ෂයේ එක් එක් කාල සීමා තුළ සංසද මාලාවන් (SLIDA Forum) සංවිධානය කිරීම සහ පැවැත්වීම.

| අනු අංකය | වැඩසටහනේ නම | පැවැත්වූ දිනය |
|---|---|---|
| 1. | මුදල් සඳහා වටිනාකමක් (Value for Money) | 2023.05.24 |
| 2. | ශ්‍රී ලංකාව ඉතාමත් තීරණාත්මක අවස්ථාවක: රජය සතු ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීම සහ ඉන් ඔබ්බට බලපෑම් (Sri Lanka at cross road: Restructuring State Owned Enterprises (SOEs) and Impact Beyond) | 2023.05.31 |
| 3. | ආර්ථිකය යථා තත්ත්වයට පත්කරලීම උදෙසා ශූන්‍ය-පාදක අයවැයකරණය (Zero-Based Budget for Economic Recovery) | 2023.09.06 |
| 4. | ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අභියෝග (Challenges in Implementing Public Private Partnership Projects in Sri Lanka) | 2023.10.27 |

### 7.8 අධ්‍යයන මණ්ඩලයක් (Academic Board) ස්ථාපනය කිරීම

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යයන වැඩසටහන්වල විශිෂ්ටත්වය පවත්වා ගනිමින් ඉහළ ගුණාත්මක තත්ත්වයේ පුහුණු සැපයීම සඳහා අධ්‍යයන මණ්ඩලයක් ස්ථාපනය කිරීම.

### 7.9 Credit Based Qualification System

ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට (Sri Lanka Qualification Framework - SLQF) අනුකූලව 2024 වර්ෂයේ සිට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් Credit-Based Qualification System (CBQS) ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පාඨමාලා ඒකක සඳහා ලකුණු අගයන් නිර්ණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට (SLQF) අනුගතව වන අතර, එහිදී දේශන සඳහා වෙන්කර ඇති පැය ගණන, අඛණ්ඩ පැවරුම්, ප්‍රායෝගික සැසි, සහ ක්ෂේත්‍ර චාරිකා මගින් සෑම පාඨමාලා ඒකකයක් සඳහාම නියම කර ඇති ලකුණු අගය ප්‍රමාණාත්මකව පිළිබිඹු වේ.

# ආයතනික සංවර්ධන අංශය

08

**හැඳින්වීම**

ආයතනික සංවර්ධනය (Organizational Development - OD) යනු පුළුල් හා ක්‍රමෝපායික ක්‍රියාවලියක් වන අතර එමගින් ක්‍රමෝපාය, ව්‍යුහයන් හා ක්‍රියාවලි සකස්කිරීම, වැඩිදියුණු කිරීම හා ශක්තිමත් කිරීම ඔස්සේ වෙනස්වීම් හා ඉහළ කාර්යක්ෂමතාවයක් සාක්ෂාත් කරගැනීම උදෙසා ආයතනවලට සිය ධාරිතාවයන් ගොඩනංවා ගැනීම සඳහා සහාය ලබා දෙයි.

මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි දැක්විය හැක;

- ඉලක්ක කේන්ද්‍රීය ආයතනික ක්‍රියාවලියක් සැලසුම් කිරීම.
- රාජ්‍ය අංශයේ ආයතන හා රජය සතු ව්‍යවසායන්ගේ සේවා සැපයුම් ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා ආයතනික සංවර්ධන සේවා පැවැත්වීම.
- කළමනාකරණ උපදේශක ක්‍රියාවලිය හා එම ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීම.
- දේශීය වෘත්තීයවේදී ආයතන සමඟ ජාලයක් ගොඩනැංවීම.
- ජාත්‍යන්තර වශයෙන් ආයතනික සහයෝගීතාවයන් ගොඩනැංවීම.
- අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ආරම්භ කිරීම.

**ප්‍රධාන කාර්යයන්**

**කළමනාකරණ උපදේශකත්ව පැවරුම්**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කළමනාකරණ උපදේශකත්ව ක්‍රියාවලිය කාර්යක්ෂමව සහ මනාව සංවිධිත කරන ලද අතර, අවශ්‍යතානුකූලව සලකා ඇතැම් නව නිර්ණායක ද ක්‍රියාවලිය සඳහා ඇතුළත් කරන ලදී.

කළමනාකරණ උපදේශකත්වවල ප්‍රගතිය

- වර්ෂය තුළ කළමනාකරණ උපදේශක කාර්යය සඳහා ලියාපදිංචිවීම් - 21
- වර්ෂය තුළ පැවැත්වෙමින් තිබූ කළමනාකරණ උපදේශක කටයුතු - 05

| උපදේශක කාර්යය | | ආයතනය |
|---|---|---|
| 1. | බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීම | මහවැලි උපදේශක සේවා කාර්යාංශය |
| 2. | ජාතික ඛනිජ ප්‍රතිපත්තියේ කෙටුම්පත ඉදිරිපත් කිරීම සඳහා සකස් කිරීම | පරිසර අමාත්‍යාංශය |
| 3. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කටයුතු කලාපීය ලේකම් කාර්යාල මට්ටමෙන් පුළුල් කිරීම | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව - ප්‍රවාහන අමාත්‍යාංශය |
| 4. | සේවක කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම ඔස්සේ ඵලදායිතාවය ඉහළ නැංවීම | ශ්‍රී දළදා මාලිගාව, මහනුවර |
| 5. | ක්‍රමෝපායික සැලැස්ම 2024-2029 සකස් කිරීම | ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල |

- වැඩ කටයුතු අවසන් කළ කළමනාකරණ උපදේශන කටයුතු - 10

| උපදේශක කාර්යය | | ආයතනය |
|---|---|---|
| 1. | පරිපාලන සහ මුදල් රෙගුලාසි පිළියෙල කිරීම | හලාවත වැවිලි සමාගම |
| 2. | කාර්යාලීය සංවිධාන සැලැස්ම පිළියෙල කිරීම | උක් පර්යේෂණ ආයතනය |
| 3. | ඉදිරි මානව සම්පත් සැලැස්ම පිළියෙල කිරීම සඳහා වැඩ අධ්‍යයනය | ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් |
| 4. | කාර්ය පටිපාටික අත්පොත් සකස් කිරීම | ලංකා විදුලි (පුද්ගලික) සමාගම |
| 5. | ආයතනික සම්පත් සැලසුම්කරණ ක්‍රමය (ERP System) 2 වන අදියර ක්‍රියාත්මක කිරීම | දෙහිවල -ගල්කිස්ස මහනගර සභාව |
| 6. | බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීම | විදුලි සංදේශ නියාමන කොමිසම |
| 7. | මැතිවරණ කොමිසමට පැවරෙන වැඩ කොටස තක්සේරු කිරීම හා කාර්ය මණ්ඩලය සමාලෝචනය කිරීම | මැතිවරණ කොමිසම |
| 8. | විනය පටිපාටිය/ ආචාර ධර්ම සංග්‍රහය පිළියෙල කිරීම | මාන්තායි ලුණු සමාගම |
| 9. | සංයුක්ත සැලැස්ම - 2021-2025 පිළියෙල කිරීම | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම |
| 10. | පරිසර සංවේදී ක්ෂේත්‍ර (ESAs) පිළිබඳ පුහුණු මොඩියුල සකස් කිරීම (මොඩියුල 16) සහ පුහුණු වැඩසටහන් දියත් කිරීම | පරිසර අමාත්‍යාංශය - එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් අරමුදල් සැපයේ |

### 8.1 2023 වර්ෂය තුළ දී දේශීය ආයතන සමඟ ජාලගතවීම

- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - ශ්‍රී ලංකාව සඳහා කාලගුණ හා ආපදා අවදානම් මූල්‍යයනය සඳහා ප්‍රවේශවීම හා එහි කටයුතු ඉහළ නැංවීම සඳහා වන දෙවන තාක්ෂණික සංවාදය.

- විදේශ සම්පත් දෙපාර්තමේන්තුව - ජාත්‍යන්තරය සඳහා නිරාවරණය වීම හා නියමිත කාලාන්තර තුළ පුහුණුව ඔස්සේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යයනේන්ද්‍රීය කාර්ය මණ්ඩලයේ කුසලතා ඉහළ නැංවීම.

- ශ්‍රී ලංකාව තුළ කාලගුණ හා ආපදා අවදානම් කළමනාකරණය, ආපදා අවදානම් සම්බන්ධිත මූල්‍යයන හුවමාරු, සහයෝගීතාවයන්, ඒකාබද්ධ ක්‍රියාමාර්ග හා ඉදිරි කටයුතු - SLYCAN TRUST (GTE) Ltd.

- තිරසර සංවර්ධන ඉලක්ක සඳහා ශ්‍රී ලංකා පාර්ශවකරුවන්ගේ ප්‍රකාශිත ප්‍රතිපත්තිය - තිරසර සංවර්ධන තක්සේරුවක් ඔස්සේ ජාතික අර්බුදය

### 8.2 විදේශ ආයතන සමඟ සහයෝගීතාවයන්

- සිංගප්පූරුවේ සිවිල් සේවා විදුහල
- එක්සත් රාජධානියේ සිවිල් සේවා විදුහල
- කේ.පී.අයි.ආයතනය, ඕස්ට්‍රේලියාව
- රාජ්‍ය ප්‍රතිපත්ති කළමනාකරණය පිළිබඳ කේ.ඩී.අයි විදුහල, දකුණු කොරියාව
- කින්ග්ස් විදුහල, ලන්ඩන්
- පාලනය පිළිබඳ ජාතික ඇකඩමිය, චීනය
- යහපාලනය පිළිබඳ ජාතික මධ්‍යස්ථානය, ඉන්දියාව

මේ සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු සිදුකර තිබේ.

## 8.3 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ආයතනික වැඩිදියුණු කිරීම්

- හරිත එලදායිතාවය හා එහි ප්‍රගමනය උදෙසා දැනට පවතින ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා එලදායිතාවය වැඩිදියුණු කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපනය කරන ලදී.
- 2024 වර්ෂය සඳහා ආයතනයේ පෙරදැක්ම යාවත්කාලීන කිරීම (prospectus for year 2024)

    - **පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය**
      ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සේවා පුළුල් කිරීමේ යාන්ත්‍රණය හා පාර්ශවකරුවන්ගේ ප්‍රතිචාර යොදා ගනිමින්, පුහුණු අවශ්‍යතා විශ්ලේෂණයක් සිදුකරන ලදී. ඒ අනුව, දැනට පවතින වැඩසටහන් යාවත්කාලීන කිරීම සිදුකරන ලදී.

    - **ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ක්‍රමෝපායික සැලැස්ම 2023-2027 සම්පූර්ණ කිරීම**
      ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ක්‍රමෝපායික සැලැස්ම මගින් ආයතනය සඳහා දිශානතිය ස්ථාපනය කර තිබේ. ආයතනික දැක්ම හා මෙහෙවර ළඟාකර ගැනීම සඳහා ආයතනික අවධානය තියුණු කිරීම මෙමඟින් සිදුවේ. අධ්‍යයනේන්ද්‍රිය හා කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සියලු සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් ක්‍රමෝපායික සැලසුම් ක්‍රියාවලිය සිදුකරන ලද අතර සලකනු ලබන කාල සීමාව තුළ ඔවුන්ගේ ප්‍රයත්නයන් හෝ කාර්යයන් කෙරෙහි අවධානය යොමුකර නිරවද්‍ය ඉලක්ක, අරමුණු සහ මූලාරම්භ පියවරයන් වැඩිදියුණු කිරීමට එමඟින් ආයතනයට හැකිවේ.

ආයතනයේ සේවකයන් සඳහා පැහැදිලි ක්‍රියාකාරී සැලැස්මක් නිර්මාණය කිරීම සඳහා ක්‍රමෝපායික සැලැස්ම දායක වේ.

**පුහුණු සහ සංවර්ධනය**

- අදාළ අනිවාර්ය පුහුණු මොඩියුල සහ සැසි සැලසුම් කිරීම
- ආයතනික ඉල්ලීම්වලට අනුකූලව අවශ්‍යතානුකූලව සකස් කරන වැඩසටහන් සහ සැසි සැලසුම් කිරීම
- දේශන සිදුකිරීම
- සම්බන්ධීකරණය
- ඇගයීම් වාර්තා ලිවීම

    - **අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධන වැඩසටහන**
      ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සහාය කාර්ය මණ්ඩලයේ පුහුණු අවශ්‍යතා සමීක්ෂණය මත පදනම්ව, පහත සඳහන් ධාරිතා සංවර්ධන වැඩසටහන් සැලසුම් කරන ලදී.

- වැඩසටහන් නිලධාරීන් සඳහා
- වැඩසටහන් සහකාරවරුන් සඳහා
- කාර්යාල කාර්ය සහායක හා රියදුරන් සඳහා

# පශ්චාත් උපාධි අධ්‍යයන අංශය (SPS)

# 09

### 9.1 පසුබිම

1985 අංක 07 දරන පනතින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25(අ) වගන්තිය යටතේ නිකුත් කළ නියමයකට අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2003 වර්ෂයේ දී, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලනය ආයතනය වෙත පශ්චාත් උපාධි මට්ටමේ උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය පිරිනමා ඇත. ඒ අනුව, පශ්චාත් උපාධි අධ්‍යයනායතනය පිහිටුවන ලදී. ඉන් අනතුරුව, එම ආයතනය ජාතික, කලාපීය හා අන්තර්ජාතික මට්ටම්වල රාජ්‍ය අංශයේ වෘත්තිකයන් සමඟ අඛණ්ඩව සම්බන්ධ වී කටයුතු කරන ලදී. මෙම පශ්චාත් උපාධි වැඩසටහන පුද්ගලික අංශය වෙත ද විවෘත අතර උපාධි පාඨමාලා සතියේ දිනවල මෙන්ම සතිඅන්ත දිනවලද වශයෙන් පැවැත්වෙන බැවින් ත්‍රිවිධ හමුදා, පොලීසිය සහ සෞඛ්‍ය අංශයේ සේවකයන් විසින් වඩාත් ඉල්ලුම් කරන වැඩසටහන බවට මෙය පත්වී තිබේ. ස්වකීය කළමණාකරුවන් වෙතින් අමාත්‍යාංශ ලේකම්වරු, විධායක නිලධාරීන් මෙන්ම අනෙකුත් පාර්ශවකරුවන් සැවොම එක සමාන ආකාරයෙන් අගය එකතු කළ දායකත්වයක් වැඩි වශයෙන් ඉල්ලුම් කරනු ලබන සීඝ්‍රයෙන් වෙනස්වන හා අභියෝගාත්මක වර්තමාන රාජ්‍ය කළමනාකරණ වාතාවරණය හමුවේ පශ්චාත් උපාධි රාජ්‍ය කළමනාකරණ වැඩසටහන සකස් කිරීම සඳහා පදනම වැටී තිබේ. මෙම සුවිශේෂී පශ්චාත් උපාධි රාජ්‍ය කළමනාකරණ වැඩසටහන මගින් එම පාඨමාලාව හදාරන තැනැත්තන් වෙත පශ්චාත් උපාධියක් හිමිකර ගැනීමේ අවස්ථාව සහ විවිධ කළමනාකරණ මට්ටම්වල දී විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීම සඳහා අවශ්‍ය නිපුණතා ලබාදීම ද සිදු වේ.

පශ්චාත් උපාධි අධ්‍යයනායතනයේ රාජ්‍ය කළමනාකරණ පශ්චාත් උපාධි වැඩසටහන් මෙරට තුළ ක්‍රියාත්මක වන ප්‍රමුඛතම ප්‍රායෝගික පශ්චාත් උපාධි වැඩසටහන්වලින් එකකි. එනිසා, පාඨමාලාව සඳහා සහභාගිකයන් තෝරාගැනීමේ ක්‍රියාවලිය, වැඩසටහනේ අන්තර්ගතය හා පාඨමාලාව පවත්වාගෙන යෑමේ ශෛලිය වෙනත් මෙවැනි ආකාරයේ වැඩසටහන්වලින් වෙනස් වේ. මෑත කාලීනව බඳවා ගනු ලැබූ කණ්ඩායම් සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් සංඛ්‍යාව පහත පරිදි වේ: MPM 2018/20 - 77, MPM 2019/21 - 91, MPM 2020/22 - 50, MPM 2021/23 - 25.

### 9.2 ආරාධිත දේශන මාලාව

පශ්චාත් උපාධි අධ්‍යයනායතනය විසින් කොරියාවේ Saemaul පදනමේ ශ්‍රී ලංකා කාර්යාලය සමඟ සහයෝගීතාවයෙන් 2023.05.25 වැනි දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පරිශ්‍රයේ ආරාධිත දේශනයක් සංවිධානය කරන ලදී. එම ආරාධිත දේශනය “The Miracle of Han River” යන මාතෘකාව යටතේ පැවැත්විණි. මෙහි අරමුණ වූයේ කොරියාවේ ආර්ථික සංවර්ධන අත්දැකීම් හුවමාරු කරගැනීම සහ දුගීබව පිටුදැකීම සඳහා දායකත්වයක් ලබාගැනීමට Saemaul Undong ආකෘතිය (ග්‍රාමීය ප්‍රදේශවලට නව ජීවයක් ලබාදීම සඳහා ඉතා වැදගත් ආකෘතියකි) යොදා ගැනීමේ හැකියාව පිළිබඳ දැනුවත් කිරීම යි.

“ඵලදායී ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම” මැයෙන් වූ ආරාධිත දේශනයක් පශ්චාත් උපාධි අධ්‍යයනායතනය විසින් සංවිධානය කරන ලදී. අග්‍රාමාත්‍ය ලේකම්වරයෙකු වශයෙන් කටයුතු කර ඇති එම්.ඩී.ඩී.පීරිස් මහතා සම්පත්දායක වශයෙන් මෙම දේශනය සිදුකරන ලදී.



"The Miracle of Han River" දේශනයේ අවස්ථා

### 9.3 පශ්චාත් උපාධි වැඩසටහන්වල ගුණාත්මකබව සහතික කිරීම

තත්ත්ව සහතිකකරණය සඳහා මධ්‍යස්ථානයක් (Center for Quality Assurance) ස්ථාපනය කිරීම සඳහා වූ යෝජනාව 2023.04.28 දිනැතිව පාලක සභාව විසින් අනුමත කරන ලදී. ඉන් අනතුරුව, පශ්චාත් උපාධි අධ්‍යයනායතනය විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි වැඩසටහන් ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට (Sri Lanka Qualification Framework - SLQF) අනුකූලව සකස් කිරීමේ අරමුණින් මූලික පියවර කිහිපයක් ගෙන තිබේ.

### 9.4 එක් අවුරුදු රාජ්‍ය කළමනාකරණ පශ්චාත් උපාධි වැඩසටහන

මීට අමතරව, පශ්චාත් උපාධි අධ්‍යයනායතනය විසින් එක් අවුරුදු රාජ්‍ය කළමනාකරණ පශ්චාත් උපාධි වැඩසටහනක් මීලඟට බඳවා ගන්නා කණ්ඩායම සඳහා හඳුන්වාදීමට ද ආරම්භක පියවර ගෙන තිබේ.

# 2023 වර්ෂයේ දී පවත්වන ලද විභාග

# 10

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විභාග අංශය විසින් 2023 වර්ෂය තුළ දී විභාග 73ක් පවත්වා ඇති අතර එයින් විභාග 55ක් බාහිර ආයතන වෙනුවෙන් පැවැත්වූ විභාග වන අතර විභාග 18ක් මෙම ආයතනයේ වැඩසටහන් සඳහා අදාළව පැවැත්වූ විභාග වේ.

බාහිර ආයතන වෙනුවෙන් පැවැත්වූ විභාග අතරට තනතුරු සඳහා බඳවා ගැනීමේ විභාග, කාර්යක්ෂමතා කඩඉම් විභාග හා උසස්වීමේ විභාග ඇතුළත් විය. 2023 වර්ෂය තුළ දී, පවත්වන ලද විභාගවල විස්තර පහත වගුවේ අන්තර්ගත වේ.

**10.1 අභ්‍යන්තර විභාග - 2023**

| අනු අංකය | ආයතනය | විභාගය | අයදුම්කරුවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | SLIDA | කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව - 2020/21 අසමත්වූවන් සඳහා නැවත පැවැත්වූ විභාගය | 14 |
| 2. | SLIDA | Diploma in Professional English - 2022 පාඨමාලාව, 1 වන කණ්ඩායම - II වන මට්ටමේ විභාගය | 24 |
| 3. | SLIDA | කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව - 2021/22 II වැනි අධ්‍යයන වාරයේ විභාගය | 36 |
| 4. | SLIDA | කළමනාකරණ සහකාරවරුන් (තාක්ෂණික නොවන) සඳහා දෙවන කාර්යක්ෂමතා විභාගය | 07 |
| 5. | SLIDA | Diploma in Professional English පාඨමාලාවේ අසමත්වූවන් සඳහා නැවත පැවැත්වූ විභාගය | 20 |
| 6. | SLIDA | Diploma in Professional English - 2022 පාඨමාලාව, 2 වන කණ්ඩායම - I වන මට්ටමේ විභාගය | 41 |
| 7. | SLIDA | විගණනය පිළිබඳ ඩිප්ලෝමාව - අසමත්වූවන් සඳහා නැවත පැවැත්වූ විභාගය | 07 |
| 8. | SLIDA | රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව - 2022/23 II වැනි අධ්‍යයන වාරයේ විභාගය | 61 |
| 9. | SLIDA | රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව - 2022/23 III වැනි අධ්‍යයන වාරයේ විභාගය | 71 |
| 10. | SLIDA | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව - 2019/21 සහ 2020/22 IV වැනි අධ්‍යයන වාරයේ විභාගය | 90 |
| 11. | SLIDA | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව - 2021/23 I වැනි අධ්‍යයන වාරයේ විභාගය | 40 |
| 12. | SLIDA | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව - 2021/23 II වැනි අධ්‍යයන වාරයේ විභාගය | 30 |
| 13. | SLIDA | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව - 2019/21 සහ 2020/22 V වැනි අධ්‍යයන වාරයේ විභාගය | 90 |

| | | | |
|---|---|---|---|
| 14. | SLIDA | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව - 2021/23 III වැනි අධ්‍යයන වාරයේ විභාගය | 28 |
| 15. | SLIDA | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව - 2019/21 සහ 2020/22 VI වැනි අධ්‍යයන වාරයේ විභාගය | 77 |
| 16. | SLIDA | තාක්ෂණික සහකාරවරුන් (සිවිල්) - MA 2-1 සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 01 |
| 17. | SLIDA | තාක්ෂණික සහකාරවරුන් (පරිගණක තාක්ෂණික සහකාරවරුන්) - MA 2-1 සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 01 |
| 18. | SLIDA | වැඩසටහන් නිලධාරීන් - JM 1-1 සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 04 |
| 19. | SLIDA | කළමනාකරණ සහකාරවරුන් (තාක්ෂණික නොවන) - MA 1-1 සඳහා පළමු කාර්යක්ෂමතා විභාගය | 11 |

### 10.2 බාහිර විභාග - 2023

| අනු අංකය | ආයතනය | විභාගය | අයදුම්කරුවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | විදුලිබල මණ්ඩලය | විගණන සහකාර (අභ්‍යන්තර) බඳවාගැනීම සඳහා වන තරග විභාගය | 143 |
| 2. | විදේශ කටයුතු අමාත්‍යාංශය | ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩලවල කළමනාකරණ සේවා නිලධාරී සේවයේ තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රායෝගික ඇගයීම | 171 |
| 3. | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 818 |
| 4. | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | දීප ව්‍යාප්ත සේවාවන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 567 |
| 5. | ආරක්ෂක අමාත්‍යාංශය | නීති නිලධාරීන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 02 |
| 6. | හානිපූරණය සඳහා වන කාර්යාලය | කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 04 |
| 7. | හානිපූරණය සඳහා වන කාර්යාලය | කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 03 |
| 8. | ආරක්ෂක අමාත්‍යාංශය | රාජ්‍ය බුද්ධි සේවයේ පර්යේෂණ නිලධාරීන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 09 |
| 9. | අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය | MM 1-1 සේවා කාණ්ඩයේ නිලධාරීන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 03 |
| 10. | සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය | කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ II පන්තියේ (තාක්ෂණ) නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 01 |
| 11. | ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය | තාරකා විද්‍යා ප්‍රදර්ශක තනතුරෙහි පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 01 |
| 12. | ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය | තාරකා විද්‍යා කථිකාචාර්ය තනතුරෙහි පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 02 |

| | | | |
|---|---|---|---|
| 13. | වාණිජ දෙපාර්තමේන්තුව | නීති නිලධාරී සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 01 |
| 14. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | කළමනාකරණ සහකාර (තාක්ෂණික/ තාක්ෂණික නොවන) නිලධාරීන් (වන සත්ත්ව අඩවි ආරක්ෂක III) සඳහා තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 05 |
| 15. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | කළමනාකරණ සහකාර - තාක්ෂණික/ තාක්ෂණික නොවන නිලධාරීන් (වන සත්ත්ව නියාමක/ සහකාර II) සඳහා තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 02 |
| 16. | ජල සම්පත් සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) 2 වැනි ඛණ්ඩයේ නිලධර ගණයට අයත් නිලධාරීන් සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 75 |
| 17. | මුදල් අමාත්‍යාංශය | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 06 |
| 18. | පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | සහකාර කොමසාරිස්වරුන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 01 |
| 19. | පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය | සේවා කාණ්ඩයේ නිලධාරීන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 05 |
| 20. | කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය | කළමනාකරණ සහකාර ( තාක්ෂණික නොවන) 2 වැනි ඛණ්ඩයේ සේවා ගණයට අයත් නිලධාරීන් සඳහා තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 01 |
| 21. | ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව | I ශ්‍රේණියේ විදේශ ගමන් බලපත්‍ර සහකාර නිලධාරීන් තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 28 |
| 22. | පරිසර අමාත්‍යාංශය | වැඩසටහන් සහකාරවරුන් (I ශ්‍රේණිය) සඳහා තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 02 |
| 23. | පරිසර අමාත්‍යාංශය | වැඩසටහන් සහකාරවරුන් (II ශ්‍රේණිය) සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 11 |
| 24. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | කළමනාකරණ සහකාර (තාක්ෂණික/ තාක්ෂණික නොවන) නිලධාරීන් (වන සත්ත්ව අඩවි ආරක්ෂක II) සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 34 |
| 25. | පරිසර අමාත්‍යාංශය | ආශ්‍රිත සේවා ගණය සඳහා තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 02 |
| 26. | පරිසර අමාත්‍යාංශය | ආශ්‍රිත සේවා ගණය සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 12 |
| 27. | මහා භාරකාර දෙපාර්තමේන්තුව | විධායක ශ්‍රේණියේ සේවා කාණ්ඩය සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 01 |
| 28. | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | සංවර්ධන නිලධාරීන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 08 |

| | | | |
|---|---|---|---|
| 29. | අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය | JM 1-1 සේවා ගණය සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 09 |
| 30. | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) 2 සේවා ගණය සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 34 |
| 31. | ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය | කළමනාකරණ සහකාර (MA 1-2) - III ශ්‍රේණිය සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 02 |
| 32. | ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය | කණිෂ්ඨ කළමනාකරු (JM 1-2) II ශ්‍රේණිය සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 01 |
| 33. | විදුලිබල මණ්ඩලය | විගණන ලිපිකරු II නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 38 |
| 34. | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | සහකාර කොමසාරිස්වරුන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 01 |
| 35. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) 2 සේවා බණ්ඩයේ නිලධාරීන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 126 |
| 36. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | කළමනාකරණ සහකාරවරුන් (තාක්ෂණික/ තාක්ෂණික නොවන) සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 09 |
| 37. | ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව | විධායක ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 04 |
| 38. | ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය | අධ්‍යයන පර්යේෂණ නිලධාරී සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 02 |
| 39. | ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය | සම්බන්ධීකරණ සහකාරවරුන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 04 |
| 40. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | ආශ්‍රිත සේවා නිලධාරීන් සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (විශ්‍රාම වැටුප් නිලධාරී) | 14 |
| 41. | වාරිමාර්ග අමාත්‍යාංශය | කළමනාකරණ සහකාරවරුන් (තාක්ෂණික නොවන) සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 03 |
| 42. | සමුපකාර සේවක කොමිෂන් සභාව | විධායක සේවා කාණ්ඩයේ නීති නිලධාරී තනතුර සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 01 |
| 43. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | II ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) සහ සහකාර අධ්‍යක්ෂ (සම්මත ලංසු ලේඛන ලියාපදිංචි කිරීම්) සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 02 |
| 44. | මුදල් අමාත්‍යාංශය | කළමනාකරණ සහකාරවරුන් (තාක්ෂණික නොවන) සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 02 |
| 45. | වනජීවී සහ වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 03 |

| | | | |
|---|---|---|---|
| 46. | ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | නීති සහකාරවරුන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 04 |
| 47. | රාජ්‍ය සේවා කොමිෂන් සභාව - සබරගමුව පළාත් සභාව | ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන් සඳහා තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 10 |
| 48. | මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව | විද්‍යාත්මක සේවයේ නිලධාරීන් සඳහා තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 05 |
| 49. | අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය | කළමනාකරණ සහකාර 1-1 සේවා ගණයේ නිලධාරීන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 11 |
| 50. | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 2 වැනි ගණයේ II ශ්‍රේණියේ ක්ෂේත්‍ර/ කාර්යාලගත නිලධාරීන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 36 |
| 51. | ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය | II ශ්‍රේණියේ සහකාර කළමනාකරු (MM 1-2) සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 01 |
| 52. | සමාජ සේවා දෙපාර්තමේන්තුව | විධායක නිලධාරීන් සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 01 |
| 53. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | පද්ධති විශ්ලේෂක සහ ගිණුම් නිලධාරී සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 02 |
| 54. | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | කළමනාකරණ සහකාරවරුන් (තාක්ෂණික නොවන) සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 132 |
| 55. | ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය | II ශ්‍රේණියේ පරීක්ෂකවරු සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 65 |
| 56. | පරිසර අමාත්‍යාංශය | II ශ්‍රේණියේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික/ තාක්ෂණික නොවන) සේවා ගණය සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 01 |
| 57. | හින්දු ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නොවන) සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 01 |
| 58. | පරිවාස සහ ළමාරක්ෂක දෙපාර්තමේන්තුව | III ශ්‍රේණියේ උපදේශන නිලධාරීන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 02 |
| 59. | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | නිෂ්පාදන සහකාරවරුන් සහ ලේඛන සහකාරවරුන් සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 11 |

# තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය


# 11

රාජ්‍ය අංශයේ ආයතනවල සහ නිලධාරීන් අතර තොරතුරු තාක්ෂණ හැකියාවන් වැඩිදියුණු කිරීම උදෙසා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ තොරතුරු සහ තාක්ෂණ අංශය කැප වී සිටී. ඊ-රාජ්‍ය සංකල්පය සාර්ථක අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දීමක් වශයෙන් අත්‍යවශ්‍ය පුහුණු සහ උපදේශන සේවා සැපයීම අපගේ මූලික අරමුණ වේ.

අපගේ ප්‍රයත්නයන් යොමුව පවතිනුයේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා යොදාගත හැකි නව්‍ය තාක්ෂණය සඳහා තොරතුරු පද්ධති ස්ථාපනය කිරීම පිණිස වේ. මනා තාක්ෂණික දැනුමෙන් හෙබි නිපුණතාවය සහිත ඵලදායි සිවිල් සේවක ව්‍යුහයක් සකස් කිරීමට දායකවෙමින්, ආයතනයේ වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය හරහා ඒකාබද්ධ පුහුණු වැඩසටහන් අප විසින් සක්‍රීයව ප්‍රවර්ධනය කරනු ලැබේ.

මෙම වර්ෂයේ දී, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය විසින් මාර්ගගත ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගනිමින් මාර්ගගත සම්මන්ත්‍රණ (webinar programmes) සංවිධානය කිරීම සහ පැවැත්වීම සිදුකරන ලදී. එම මාර්ගගත සම්මන්ත්‍රණ සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමට පහසුකම් සැලැස්වීම සඳහා ෆේස්බුක් හා යු ටියුබ් වැනි ආයතනයේ නිල සමාජ මාධ්‍ය පිටු හරහා මාර්ගගත වැඩසටහන් අවස්ථා ලබාදෙන ලදී. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් මාර්ගගත යාන්ත්‍රණ ඔස්සේ විභාග සඳහා අයදුම්කිරීමේ හා ලියාපදිංචි වීමේ ක්‍රියාවලීන් ද සංවිධිත කරන ලදී. Microsoft Teams software ආධාරයෙන් දේශන සහ සම්මන්ත්‍රණ මාර්ගගත ක්‍රමය ඔස්සේ බාධාවකින් තොරව පවත්වන ලදී.

සේවාවල ගුණාත්මකබව තවදුරටත් වැඩිදියුණු කිරීම උදෙසා, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලන අධිකාරියේ තොරතුරු තාක්ෂණ අංශය විසින් විවිධ ව්‍යාපෘති ආරම්භ කරන ලදී. ආයතනයේ වෙබ් අඩවිය නැවත සකස් කිරීම, වැඩසටහන් නියමිත කාලසීමා තුළ සැලසුම් කිරීම සඳහා ආධාරයක් වශයෙන් වැඩසටහන් පාලන පද්ධතියක් සකස් කිරීම, සහ විභාග අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ භාරගැනීම සඳහා පද්ධතියක් සකස්කිරීම මීට ඇතුළත් වේ.






මෙම ප්‍රයත්නයන්ට අමතරව, තොරතුරු තාක්ෂණ අංශය විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පවත්වන සම්මන්ත්‍රණ සහ දේශන සම්බන්ධීකරණය කිරීම සක්‍රීය ආකාරයෙන් සිදුකෙරේ. ඡායාරූප සහ පටිගත කිරීම් ලබාගැනීම සහ ඉන් අනතුරුව ඒවා ආයතනයේ නිල ෆේස්බුක් පිටුව හරහා ප්‍රචාරණය කිරීම මීට ඇතුළත් වේ. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් වාර්තා වැඩසටහන් සකස් කිරීම සිදුකරන අතර, සහභාගිකයන් සඳහා පරිපූර්ණ සහ සිත්ගන්නා සුළු අත්දැකීමක් සහතික කරමින් වැඩසටහන් සඳහා පසුබිම් තල ලබා දීම ද සිදු කෙරේ.

### 11.1 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල සීමාව තුළ පවත්වන ලද සේවාරම්භක හා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන්

| අනු අංකය | වැඩසටහන | දින ගණන | ඉලක්කගත වැඩ සටහන් සංඛ්‍යාව | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගිකයන් සංඛ්‍යාව | සහභාගිත්ව දින ගණන |
|---|---|---|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 වන පන්තියේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන 2023.10.16 -2023.10.27 | 10 | 10 | 10 | 33 | 330 |
| 2. | ආනයන හා අපනයන පාලක දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණ පුහුණු උපදේශකත්වය 2023.11.09 - 2023.12.07 | 5 | 5 | 5 | 10 | 50 |
| 3. | රජයේ නිලධාරීන් සඳහා සයිබර් ආරක්ෂාව සහ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය විසින් සංවිධානය කරන ලදී. | 13 | 13 | 13 | 800 | 10,400 |
| | **එකතුව** | **28** | **28** | **28** | **843** | **10,780** |




සයිබර් ආරක්ෂාව පිළිබඳ පුහුණු වඩසටහන්, රජයේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්.

## 11.2. 2023 වර්ෂයේ දී පවත්වන ලද මාර්ගගත වැඩසටහන්

- විවිධ පාර්ශවකරුවන්ගේ සහයෝගිතාවයෙන් පැවති නායකත්ව වැඩසටහන (Cross-Sector Leadership Programme)
- ශ්‍රී ලංකාව තීරණාත්මක සන්ධිස්ථානයක; "රජය සතු ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීම සහ එහි පසුවිපරම්" මැයෙන් වූ කණ්ඩායම් සාකච්ඡාව
- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සංක්‍රාන්ති ලිංගිකත්වය නීත්‍යානුකූල කිරීම
- සයිබර් ආරක්ෂාව පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය
- SLIDA උපදේශකත්ව වැඩසටහන: එම්.සෝමසුන්දරම් මහතා ඇතුළු උපදේශකයන් 19 දෙනෙකු සඳහා අභිනන්දන වැඩසටහන
- රාජ්‍ය- පුද්ගලික හවුල්කාරිත්වයන් ක්‍රියාත්මක කිරීමේ අභියෝග මැයෙන් වූ සම්මන්ත්‍රණය
- ඊ-බලපත්‍ර ක්‍රමවේදය (e-license system) සම්බන්ධයෙන් ආනයන හා අපනයන පාලක දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද පරිශීලක පුහුණු වැඩසටහන

## 11.3. 2023 වර්ෂයේ දී තොරතුරු තාක්ෂණ අංශය හරහා ආයතනය තුළ ඇති වූ නව ප්‍රවණතා

- පරිගණක විද්‍යාගාර සඳහා නව පරිගණක 46ක් අත්පත් කරගැනීම.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම සඳහා වූ අත්‍යවශ්‍ය කාර්යයන් ආරම්භ කිරීම.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ප්‍රවර්ධනය කිරීම සඳහා සමාජ මාධ්‍ය ඔස්සේ ක්‍රමෝපායික ප්‍රචාරණ වැඩසටහන් දියත් කිරීම.
- පර්යේෂණ අංශය තුළ පරිගණක ජාලයක් ස්ථාපනය කිරීම.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය තුළ අධිවේගී අන්තර්ජාල පහසුකම් යෙදවීම.
- ආයතනික පරිගණක පද්ධතිය සඳහා වැඩිදියුණු කළ ප්‍රතිවයිරස් මෘදුකාංගයක් ස්ථාපනය කිරීම.
- වැඩසටහන් අංශය සඳහා CBQS හා CAMS යන මෘදුකාංග පද්ධති ගොඩනැංවීම ආරම්භ කිරීම.

# භාෂා අධ්‍යයන මධ්‍යස්ථානය

# 12

මේ වනවිට, භාෂා අධ්‍යයන අංශය විසින් සන්ධාන භාෂාවට අදාළව මූලික වැඩසටහන් තුනක් පිරිනමයි.

1. ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Professional English
2. සහතිකපත්‍ර පාඨමාලාව - Certificate in Professional English
3. Business Writing වැඩමුළුව

- 2019 වර්ෂයේ දී පළමු කණ්ඩායම සඳහා බඳවාගත් නිලධාරීන් 23 දෙනෙකු විසින් පාඨමාලාව සාර්ථකව නිමාකළ අතර 2023 ජනවාරි මාසයේ දී ඔවුන් වෙත ඩිප්ලෝමා ප්‍රදානය කරන ලදී.
- 2022 වර්ෂය සඳහා බඳවාගත් පළමු කණ්ඩායමේ නිලධාරීන් 17 දෙනෙකු විසින් පාඨමාලාව සාර්ථකව නිමාකළ අතර, 2023 නොවැම්බර් මාසයේ දී ඔවුන් වෙත ඩිප්ලෝමා ප්‍රදානය කිරීමේ උත්සවය පැවැත්විණි.
- 2022 දෙවන කණ්ඩායම සඳහා සිසුන් බඳවා ගැනීම 2023 ජූනි 10 වැනි දින ආරම්භ වූ අතර, නිලධාරීන් 43 දෙනෙකු ලියාපදිංචි වී තිබේ.
- 2022 වර්ෂය තුළ දී business letter writing සඳහා තෙදින වැඩමුළු හතරක් (04) සාර්ථක අයුරින් පවත්වා ඇති අතර, ඒ සඳහා සමස්තයක් ලෙස නිලධාරීන් 121 දෙනෙකු සහභාගී වී තිබේ.
- 2021 වර්ෂයේ දී පරිපාලන නිලධාරි තනතුරෙහි සේවයේ නියුක්ත නිලධාරීන් අතුරින් කුසලතා පදනම මත ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගත් නිලධාරීන් 12 දෙනෙකු සඳහා පැය 28ක ඉංග්‍රීසි භාෂා මොඩියුලයක් පවත්වන ලදී.

### 12.1 2023 වර්ෂයේ දී පවත්වන ලද වැඩසටහන්:

- විදේශ කටයුතු අමාත්‍යාංශයේ කාර්යාල කාර්ය සහායක සේවයේ 30 දෙනෙකු සඳහා පවත්වන ලද ඉංග්‍රීසි කථන පුහුණු වැඩසටහන
- පාර්ලිමේන්තු නිලධාරීන් 64 දෙනෙකු සඳහා පවත්වන ලද ලේඛන කුසලතා වැඩසටහන
- රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ නිලධාරීන් 35 දෙනෙකු සඳහා පැවත් වූ ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන

- 2023 වර්ෂය තුළ දී මූලික අඩිතාලම යොදා ඇති, පහත සඳහන් වැඩසටහන් 2024 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ:
  1. Diploma in Professional Communication (DPC)
  2. Speech Craft Program (Toastmasters)

### 12.2 අවබෝධතා ගිවිසුම

පහත සඳහන් වැඩසටහන් 2024 වර්ෂයේ දී ආරම්භ කිරීමට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමඟ පස් අවුරුදු කාල සීමාවක් සඳහා අවබෝධතා ගිවිසුමක් 2023 ඔක්තෝබර් 30 වැනි දින අත්සන් කරන ලදී:


- සිංහල මාධ්‍ය නිලධාරීන් සඳහා:
  - දෙමළ භාෂා ඩිප්ලෝමාව (පැය 240)
  - දෙමළ භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (පැය 150)

- දෙමළ මාධ්‍ය නිලධාරීන් සඳහා:
  - සිංහල භාෂා ඩිප්ලෝමාව (පැය 240)
  - සිංහල භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (පැය 150)

- මෙම වැඩසටහන්වලට අමතරව, ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවේ පැරණි කණ්ඩායම් සඳහා නැවත විභාගයක් පැවැත්වීම සිදුකරන ලද අතර, පාඨමාලාව සම්පූර්ණ කළ නිලධාරීන් 24 දෙනෙකු සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව ප්‍රදානය කරන ලදී. අනෙකුත් සියලුම පැරණි ලියාපදිංචි කිරීම් 2023 ජනවාරි 01 වැනි දින සිට අවලංගු කරන ලදී.

- මීට අමතරව, දැනට භාෂා අංශය විසින් පවත්වනු ලබන සියලුම පාඨමාලාවල විෂය මාලාවන් ප්‍රතිව්‍යුහගත කිරීමේ කාර්යය ද මෙම වර්ෂය තුළ දී අවසන් කරන ලදී.







රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමේ අවස්ථාව




Diploma in Professional English - 2022 පාඨමාලාවේ පළමු කණ්ඩායමේ ඩිප්ලෝමාධාරීන්ගේ සමූහ ඡායාරූපය

Business Letter Writing තෙදින වැඩමුළුවේ විශේෂ අවස්ථා : පන්ති කාමර ක්‍රියාකාරකම්





වෘත්තීය සන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවන්ගේ විෂයමාලා සකස් කිරීම සම්බන්ධයෙන්
හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති එක්දින වැඩමුළුවේ විශේෂ අවස්ථා

# "සංධරණී" පර්යේෂණ මධ්‍යස්ථානය

13

**වැඩසටහන්**

(1) පර්යේෂකයන් සංවර්ධනය කිරීමේ වැඩසටහන් තුනක් (03) ක් රාජ්‍ය නිලධාරීන් 90 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පැවති අතර, සහතික පත්‍ර 52ක් ප්‍රදානය කර තිබේ.



රූපසටහන 1: සහතිකපත්‍රලාභීන්ගේ සමූහ ඡායාරූපයක්



රූපසටහන 2: ක්ෂේත්‍ර දත්ත රැස්කිරීම සම්බන්ධයෙන් දැනුවත් කරමින්

(2) පහත මාතෘකා යටතේ මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මාර්ගගත සම්මන්ත්‍රණ (webinar) හතරක් (04) පවත්වන ලදී.

1) 2023 මාර්තු 29 දිනැතිව පැවති "ව්‍යවසායකත්ව සංවර්ධන ප්‍රතිපත්තිය සහ ක්‍රියාත්මක කිරීම"
2) "මුදල් සඳහා වටිනාකමක්" මැයෙන් 2023 මැයි 24 දිනැතිව පැවති වැඩමුළුවට සමගාමීව පැවති මාර්ගගත සම්මන්ත්‍රණය
3) "රජය සතු ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගතකරණය සහ ඉන් ඔබ්බට බලපෑම්" මැයෙන් 2023 මැයි 31 දිනැතිව පැවති වැඩමුළුවට සමගාමීව පැවති මාර්ගගත සම්මන්ත්‍රණය
4) 2023 ජූලි 13 දිනැතිව පැවති 'Sarusara Matota'




රූපසටහන 3: "ව්‍යවසායකත්වය" මැයෙන් පැවති මාර්ගගත සම්මන්ත්‍රණයේ අත්පත්‍රිකාව




රූපසටහන 4: මුදල් සඳහා වටිනාකමක් මැයෙන් පැවති සම්මන්ත්‍රණයේ අත්පත්‍රිකාව




රූපසටහන 5: "රජය සතු ව්‍යවසාය" මැයෙන් පැවති සම්මන්ත්‍රණයේ අත්පත්‍රිකාව




රූපසටහන 6: "සරාසාර මාතොට" මැයෙන් පැවති මාර්ගගත සම්මන්ත්‍රණයේ අත්පත්‍රිකාව

(3) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් තිස්තුන් දෙනෙකු (33) සඳහා 2023 නොවැම්බර් 13 සිට 17 වැනි දින දක්වා ධාරිතා සංවර්ධන වැඩසටහනක් පවත්වන ලදී.




රූපසටහන 7: ශ්‍රී.ලං.ප.සේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැවති වැඩසටහනේදී නිළධාරීන් සක්‍රියව සහභාගී වූ අවස්ථාවක්




රූපසටහන 8: ධාරිතා සංවර්ධන වැඩසටහන සඳහා සහභාගී වූ නිලධාරීන් අතුරින් පිරිසක්

(1) කාර්තුමය වශයෙන් පුවත් පත්‍රිකා (newsletters) තුනක් (03) ප්‍රකාශයට පත්කරන ලදී (පළමු, දෙවන හා තුන්වන කාර්තු සඳහා: පිළිවෙලින් ජනවාරි - මාර්තු, අප්‍රේල් - ජුනි සහ ජුලි - සැප්තැම්බර් කලාප)










රූපසටහන 9: පළමු කාර්තුවේ පුවත් පත්‍රිකා රූපසටහන 10: දෙවන කාර්තුවේ පුවත් පත්‍රිකා රූපසටහන 11: තෙවන කාර්තුවේ පුවත් පත්‍රිකා

# 14 පොදු පරිපාලනය

### 14.1 කාර්ය මණ්ඩල තොරතුරු

**2023 දෙසැම්බර් 31 වැනි දිනට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය මණ්ඩලය**

| | අනුමත කාර්ය මණ්ඩලය | වර්තමාන කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 47 | 27 | 20 |
| තෘතීයය | 23 | 10 | 13 |
| ද්විතීය | 55 | 48 | 07 |
| ප්‍රාථමික | 41 | 32 | 09 |
| **එකතුව** | **166** | **117** | **49** |

**2023 වර්ෂය තුළ බඳවා ගැනීම්**

ස්ථිර හා ද්විතීයන පදනම මත පහත තනතුරු සම්පූර්ණ කර ඇත

| අංකය | තනතුර | පුරවන ලද තනතුරු සංඛ්‍යාව | බඳවාගැනීමේ පදනම |
|---|---|---|---|
| 01. | අධ්‍යක්ෂ ජනරාල් | 01 | ද්විතීයන |
| 02. | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්) | 01 | ද්විතීයන |
| 03. | ලේඛකාධිකාරී | 01 | ද්විතීයන |
| 04. | අධ්‍යක්ෂ(පාලන) | 01 | ද්විතීයන |
| 05. | ජ්‍යෙෂ්ඨ උපදේශක | 01 | ද්විතීයන |
| 06. | උපදේශක | 05 | ද්විතීයන |
| 07. | පරිපාලන නිලධාරී | 01 | ද්විතීයන |
| 08. | කළමනාකරණ සේවා නිලධාරී | 11 | ද්විතීයන |
| 09 | රියදුරු | 02 | ස්ථිර |
| 10. | කාර්යාල සහයක | 02 | ස්ථිර |
| 11. | බංගලා භාරකරු | 01 | ස්ථිර |

### 14.2 2023 වර්ෂය තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම




ආයතනය වටා පිහිටි මායිම් තාප්පය ප්‍රතිසංස්කරණය කිරීම



වාහන නවතා තැබීමේ අංගනය අලුත්වැඩියා කිරීම



පරිගණක විද්‍යාගාරය සඳහා පරිගණක 46ක් මිලදී ගැනීම



සංහිඳ ශාලාව සඳහා බහු මාධ්‍ය පාලන ඒකකයක් ස්ථාපනය කිරීම

# පුස්තකාල සහ තොරතුරු සේවා - ආචාර්ය එච්.එස්.වනසිංහ පුස්තකාලය

15

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ආචාර්ය එච්.එස්.වනසිංහ පුස්තකාලය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වන රාජ්‍ය හා පුද්ගලික අංශයේ විධායක නිලධාරීන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා සහාය දක්වයි. විශේෂයෙන්ම පරිශීලකයන්ගේ අධ්‍යයන අවශ්‍යතා සපුරාලීම සඳහා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අධ්‍යයන ක්ෂේත්‍රවලට අදාළ පුළුල් පරාසයක නව පොත්වලින් පුස්තකාලය සමන්විත වේ.

රාජ්‍ය ප්‍රතිපත්තිය, යහ පාලනය, මානව සම්පත් සංවර්ධනය, ආර්ථික සංවර්ධනය සහ සැලසුම්කරණය, එලදායිතාවය, පරිසර කළමනාකරණය, කාර්යය සාධන සංවර්ධනය, ගෝලීයකරණය, ව්‍යාපෘති කළමන-ාකරණය, මානව සම්පත් කළමනාකරණය, තිරසර සංවර්ධනය, ඊ-රාජ්‍යය සහ ඊ - ව්‍යාපාරික සහ ආශ්‍රිත ක්ෂේත්‍ර වැනි විෂයයන් ආවරණය කරමින් පුස්තකාලය මඟින් තොරතුරු සේවා සපයනු ලබයි.

### 15.1 2023 වර්ෂය තුළ දී පුස්තකාලය භාවිතා කිරීම

පසුගිය ප්‍රශ්නපත්‍ර, පොත්වල පරිච්ඡේද, ඊ-ග්‍රන්ථ හා ඊ-ජර්නල් වැනි ඩිජිටල්කරණ පහසුකම් ද ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය හරහා පාඨමාලා හදාරන පිරිස් වෙත නොමිලේ මාර්ගගත ආකාරයෙන් ලබාගත හැකි ය.

**සේවාරම්භක පුහුණු වැඩසටහන් වෙනුවෙන් පුස්තකාලය භාවිතා කිරීම**

| අනු අංකය | පාඨමාලාව | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1. | සේවාරම්භක පුහුණු වැඩසටහන - ශ්‍රී ලංකා පරිපාලන සේවය (කුසලතා පදනම මත) | 12 |
| 2. | සේවාරම්භක පුහුණු වැඩසටහන - ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය - II වන පන්තියේ II වන ශ්‍රේණිය | 26 |
| 3. | සේවාරම්භක පුහුණු වැඩසටහන - ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය - II වන පන්තියේ II වන ශ්‍රේණිය | 46 |
| 4. | කළමනාකරණ සේවය සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන | 162 |
| | **එකතුව** | **246** |

### 15.2 ඩිප්ලෝමා වැඩසටහන් වෙනුවෙන් පුස්තකාලය භාවිතා කිරීම

| | පාඨමාලාව | සහභාගිකයන් සංඛ්‍යාව |
|---|---|---|
| 1. | කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව | 36 |
| 2. | රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDIPPCA) (සතියේ දිනවල) 2022/23 | 50 |
| 3. | HNDIPPCA (සති අන්ත) 2022/23 | 12 |
| 4. | HNDIPPCA (සති අන්ත) 2023/24 | 24 |
| 5. | HNDIPPCA (සතියේ දිනවල) 2023/24 | 55 |
| 6. | Diploma in Professional English - 1 වැනි කණ්ඩායම | 17 |

| | | |
|---|---|---|
| 7. | Diploma in Professional English - 2 වැනි කණ්ඩායම | 37 |
| | **එකතුව** | 231 |

**15.3 පුස්තකාලය සඳහා තොරතුරු සම්පත් ලබාගැනීම සඳහා 2023 වර්ෂය තුළ දරා ඇති සමස්ත වියදම**

| අනු අංකය | මිලදී ගත් අයිතම | වියදම රු. |
|---|---|---|
| 1. | පොත් | 116,650.00 |
| 2. | වාර ප්‍රකාශන (දේශීය) | 3,000.00 |
| 3. | වාර ප්‍රකාශන (විදේශීය) | - |
| 4. | පුවත්පත් පත්‍ර | 175,964.00 |
| | **එකතුව** | **295,614.00** |

**15.4 පුස්තකාලය විසින් 2023 වර්ෂයේ දී සංවිධානය කළ විශේෂ අවස්ථා**

- **තිරසර සංවර්ධන ඉලක්ක යටතේ පුස්තකාල සේවාවල බලපෑම ඇගයීම**
  තිරසර සංවර්ධන ඉලක්ක යටතේ පුස්තකාල සේවාවල අගය හා බලපෑම ඇගයීම සහ ප්‍රදර්ශනය කිරීම පිළිබඳ වැඩමුළුවක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුස්තකාලයේ දී 2023 ජූනි 16 වැනි දින පවත්වන ලදී. විශේෂ පුස්තකාල කණ්ඩායමේ (Special Library Group) සාමාජිකයන් අතර තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණැතිව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ සහයෝගිතාවයෙන් විශේෂ පුස්තකාල කණ්ඩායම විසින් මෙම වැඩමුළුව සංවිධානය කරන ලදී.

- **පුස්තකාලය ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිය**
  2023 වර්ෂය තුළ දී KOHA පුස්තකාල පද්ධතිය වෙත ඇතුළත් කිරීම් 12,000ක් සිදු කරන ලදී.

# විශේෂ සිද්ධි සහ ජයග්‍රහණයන්

# 16

**16.1 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ උපදේශකත්ව වැඩසටහන:**

2023 දෙසැම්බර් මස 15 වැනි දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ හිටපු අධ්‍යක්ෂවරයකු වන සෝමසුන්දරම් මහතා වෙත අභිනන්දන පිරිනැමීමේ දී, එතුමාගේ සුවිශේෂී මෙහෙවර සඳහා ප්‍රණාමය පුද කරමින් ආයතනය අභිමානයෙන් ඇලලී යන අවස්ථාවේ දී අපගේ අනෙකුත් උපදේශකවරුන් ද ඔවුන්ගේ මෙහෙවර අගයනු වස් කැඳවන ලදී.

සංඛ්‍යාත්මක වශයෙන් ගණනය කළ නොහැකි තරම් පිරිසක් විශිෂ්ටත්වයට පමුණුවාලීම උදෙසා බලපෑමක් ඇතිකරලීමට දායක වූ සිය නොසැලෙන කැපවීම, මාර්ගෝපදේශකත්වය ලබාදුන් උපදේශකවරු 19 දෙනෙකුගේ සේවය ඇගයීම ද සිදුකරන ලදී. එම උපදේශකයන් වූයේ;

- එම්.ඩී.ඩී. පීරිස් මහතා
- ඔස්ටින් ප්‍රනාන්දු මහතා
- ලලිත් වීරතුංග මහතා
- උදය ආර්.සෙනෙවිරත්න මහතා
- ආචාර්ය ආර්.එච්.එස්.සමරතුංග මහතා
- ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය
- එස්.රනුග්ගේ මහතා
- වී.ජෙගරාසසිංහම් මහත්මිය
- චන්ද්‍රානි සේනාරත්න මහත්මිය
- පර්ල් වීරසිංහ මහත්මිය
- රවිනාථ් ආරියසිංහ මහතා
- ලලිත් ආර් ද සිල්වා මහතා
- පියස් ප්‍රනාන්දු මහතා
- චන්ද්‍රා ඒකනායක මෙය
- ෆායිස් මොහිදීන් මහතා
- ආචාර්ය හර්ෂ අතුරුපාන මහතා
- ආචාර්ය ට්‍රවේස් පෙරේරා මහතා
- වී.කනගසබාපති මහතා
- පද්මිණි රත්නායක මහත්මිය






















## 16.2 උපාධි ප්‍රදානෝත්සවය - රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව

රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවේ උපාධි ප්‍රදානෝත්සවය 2023 ජනවාරි මස 25 වැනි දින සාර්ථක අයුරින් පවත්වන ලදී. එම පාඨමාලාව හැදෑරූ 105 දෙනෙකු රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබාගන්නා ලදී. මෙම උත්සවය බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලදී. අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා ප්‍රධාන අමුත්තා විය. ආරාධිත අමුත්තා වූයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් නීල් බණ්ඩාර හපුහින්න මහතා ය. අග්‍රාමාත්‍ය ලේකම් අනුර දිසානායක මහතා ද මෙම අවස්ථාවට එක්විය. එමෙන්ම, පාලක සභාව විසින් අනුමත කළ අතුරු නීති මාලාව ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා 2023 මාර්තු මාසයේ දී ඉදිරිපත් කිරීමට ද පශ්චාත් උපාධි අධ්‍යයනායතනයට හැකිවිය.










### 16.3 පිරිවෙන් අධ්‍යාපන ඒකකයේ මාණ්ඩලික ශ්‍රේණියේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් පැවති ධාරිතා සංවර්ධන වැඩසටහනේ සහතිකපත්‍ර ප්‍රදානය කිරීමේ උත්සවය


අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයේ සේවයේ නියුතු මාණ්ඩලික ශ්‍රේණියේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා සහ අනෙකුත් නිලධාරීන් වෙනුවෙන් පැවති ධාරිතා සංවර්ධන වැඩසටහනෙහි සහතික පත්‍ර ප්‍රදානය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් සංවිධානය කරන ලදි.















### 16.4 "පිරිත් පිංකම" සහ දානමය පුණ්‍යකර්මය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයේ සේවයේ නියුතු මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් වෙනුවෙන් පැවති ධාරිතා සංවර්ධන වැඩසටහන අවසානයේදී, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් 80ක් පමණ වූ මහා සංඝරත්නය වෙනුවෙන් සවස ගිලන්පස පූජා කරන ලදී. එයින් අනතුරුව මහා සංඝරත්නය විසින් පිරිත් සජ්ජායනයක් සිදුකළ අතර ආයතනයේ කාර්ය මණ්ඩලය වෙත උන්වහන්සේලාගේ ස්තූතිය ද පිරිනමන ලදි.








### 16.5 තුර්කි ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (TICA) දූත පිරිසගේ පැමිණීම

තුර්කි ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ දූත පිරිසක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත පැමිණෙන ලදී. එම සංචාරයේ දී, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් ඇතුළුව අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ මෙම දූත පිරිස ඉතා සාර්ථක හා ප්‍රතිඵලදායක සාකච්ඡාවක් පවත්වන ලදී. මෙම සාකච්ඡාවේ දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ධාරිතා වැඩිදියුණු කිරීමේ වැදගත් ඉලක්ක වෙත සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සහයෝගීතාවයක් ඇතිකර ගනිමින් ශ්‍රී ලංකාව සහ තුර්කිය අතර වටිනා විශේෂඥ දැනුම හුවමාරු කර ගැනීම වැඩි  කරගැනීම කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමුවිය.





### 16.6 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය - 2023 - කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව 2020/21, 2021/22

අධ්‍යයන කටයුතුවල විශේෂඥතාවය විදහා දක්වමින්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයේ දී කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව - 2020/21, 2021/22 සහ ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාව - 2022 හැදෑරූ විශේෂ දක්ෂතාවයන් දැක්වූ පිරිස වෙත ඩිප්ලෝමා ප්‍රදානය කිරීම සිදුකරන ලදී.





### 16.7 "මඟ පෙන්වීම": ජනාධිපති ලේකම් විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් වෙත සාර්ථකත්වය සඳහා පෙළඹවීමක් ඇති කිරීම

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 2015 කණ්ඩායමේ ගමන් මාර්ගය පිළිබඳ විමසුමක් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් විශේෂ අවස්ථාවක් සංවිධානය කරන ලද අතර මෙය අදාළ සහභාගිකයන් අතර නොනැසෙන බලපෑමක් ඇතිකිරීමේ විභවතාවයක් සහිත විශිෂ්ට අවස්ථාවකි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ලේකම් ඊ.එම්.එස්.බී.ඒකනායක මහතා විසින් මෙම අනාගත නායකයන් විශිෂ්ටත්වය කරා මෙහෙයැවීමේ අරමුණින් සිය අගනා අත්දැකීම් හා දැනුම් සම්භාරය නොමසුරුව ඔවුන් සමඟ බෙදා ගන්නා ලදී. ඉගෙනුම් සහ නායකත්ව ගුණාංග වැඩිදියුණු කරගැනීම සඳහා හිතකර පරිසරයක් අභිවර්ධනය කරමින් උද්‍යෝගී ආකාරයෙන් දැනුම සහ සැඟවුණු යථාර්තය පිළිබඳ අදහස් හුවමාරුවකට මෙකී හමුව ඔස්සේ පහසුකම් සැලසුණි.





## 16.8 "The Lush Harvest from Stagnant soil -Memoirs of Ariyaratne Hewage" මැයෙන් වූ පොත එළිදැක්වීම

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිපුණත්වයෙන් හෙබි දක්ෂ නිලධරයෙකු වූ නැසීගිය ආරියරත්න හේවගේ මහතා විසින් රචිත The Lush Harvest from Stagnant Soil Memoirs of Ariyaratne Hewage" නැමති ග්‍රන්ථය එළි දැක්වීමේ උත්සවය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සංහිඳ ශ්‍රවණාගාරයේ දී 2023 ජූනි මස 22 වැනි දින පැවැත්විණි.

ගරු නීතිපති ජනාධිපති නීතිඥ සන්ජේ රාජරත්නම් මහතා, ජනාධිපති ලේකම් ඊ.එම්.එස්.බී.ඒකනායක මහතා, අග්‍රාමාත්‍ය ලේකම් අනුර දිසානායක මහතා, හිටපු ජනාධිපති ලේකම්වරුන් වූ ඔස්ටින් ප්‍රනාන්දු මහතා, ලලිත් වීරතුංග මහතා, උදය සෙනෙවිරත්න මහතා සහ හිටපු ලේකම්වරුන් වූ එස්.සී.මාන්නප්පෙරුම මහතා, ජේ.ජේ.සෙනෙවිරත්න මහතා සහ මහින්ද මඩිහේවා මහතා ඇතුළුව ඉහළ මට්ටමේ රජයේ නිලධාරීහු මෙම වැදගත් අවස්ථාවට සහභාගී වූහ. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් නාලක කලුවැව මහතා විසින් සහභාගී වූ පිරිස පිළිගෙන මෙම උත්සවයේ අරමුණ පැහැදිලි කළ අතර, හිටපු ජනාධිපති ලේකම්වරයකු වූ ඔස්ටින් ප්‍රනාන්දු මහතා විසින් ප්‍රධාන දේශනය පවත්වන ලදී.









## 16.9 රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුම

රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා සකස් කළ සිංහල හා දෙමළ භාෂා ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා හඳුන්වාදීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ භාෂා අධ්‍යයන මධ්‍යස්ථානය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමඟ එක්වී 2023.10.30 වැනි දින පස් අවුරුදු කාල සීමාවක් සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී.

රාජ්‍ය සේවයේ භාෂා අධ්‍යාපනය නවමු ආකාරයකට යොමුවීම සහතික කරන හවුල්කාරිත්වය සවිමත් කරමින් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් ප්‍රින්ස් සේනාධීර මහතා සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් නාලක කලුවැව මහතා මෙම අවබෝධතා ගිවිසුමට අත්සන් තබන ලදී.

අපගේ විශේෂ ආරාධිත අමුත්තන් වූ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ෂමින්ද මහලේකම් මහතා, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (මානව සම්පත් සංවර්ධන) ඒ.ඒ.ඩී.එස්.අතපත්තු මහතා සමගින් සියලු අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරු, ජ්‍යෙෂ්ඨ උපදේශකවරු ඇතුළු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිලධාරිහු ද මෙම අවස්ථාවට එක්වූහ.







### 16.10 සයිබර් ආරක්ෂාව පිළිබඳ දැනුවත්බව සම්බන්ධිත මාර්ගගත සම්මන්ත්‍රණය




ප්‍රවර්තන කාලීන අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවතින ඩිජිටල් පරිසරයක දී, සයිබර් තර්ජන සීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී. තාක්ෂණය අඛණ්ඩව දියුණු වන විට දී, අපගේ සයිබර් ආරක්ෂා දුර්වල කරමින් අනතුරෙහි හෙළීම සඳහා සයිබර් අපරාධකරුවන් විසින් නිරන්තරයෙන් නව තාක්ෂණයන් වැඩිදියුණු කරගනු ලැබේ. අපගේ තොරතුරු පද්ධති, ආයතනික වෙබ් අඩවි, මූල්‍ය වත්කම්, සහ ඉතා වැදගත් තොරතුරු ආරක්ෂා කරගැනීම උදෙසා මනා දැනුවත්භාවයකින් සහ සුපරීක්ෂාකාරීව සිටීම ඉතාමත් වැදගත් වේ.

සයිබර් ආරක්ෂාවට අදාළ ක්ෂේත්‍රයේ දැනුම සම්බන්ධයෙන් පවතින හිඩැස් හඳුනාගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් මෙම සම්මන්ත්‍රණය පවත්වන ලදී. විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ හිටපු ලේකම් වසන්ත දේශප්‍රිය මහතා සහ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ (SLCERT) ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරී නිරෝෂ් ආනන්ද මහතා මෙම සම්මන්ත්‍රණයේ සභික සාමාජිකයන් වශයෙන් සහභාගී වූහ. තව ද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ජ්‍යෙෂ්ඨ උපදේශක සමන්ති සේනානායක මෙය විසින් මෙම මාර්ගගත සම්මන්ත්‍රණය සඳහා පහසුකම් සලසන ලදී.

### 16.11 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සේවා පිළිබඳව රජය සතු ව්‍යවසාය දැනුවත් කිරීමේ වැඩමුළුව

ආදායම් උත්පාදනයේ සිට විවිධ සේවා සැපයීම දක්වා වූ ආර්ථික අරමුණු සහිත රජය සතු ව්‍යවසායන් යනු රජය විසින් පාලනය කරන රාජ්‍ය ව්‍යවසායන් වේ. ශ්‍රී ලංකාව තුළ රජය සතු ව්‍යවසායන් 250කට අධික සංඛ්‍යාවක් පවතී. කොවිඩ් වසංගත තත්ත්වය මෙන්ම රටෙහි පැවති ආර්ථික වාතාවරණය මධ්‍යයේ රජය සතු ව්‍යවසායන් සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය අතර සබඳතා ජාලය දුර්වල විය. මෙම සබඳතාවය ශක්තිමත් කිරීමේ අරමුණැතිව, රජය සතු ව්‍යවසායන්ගේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සඳහා 2023 ජූනි 14 වැනි දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සේවා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් සංවිධානය කරන ලදී.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් මෙම වැඩමුළුව සාර්ථක අයුරින් පවත්වන ලද අතර, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සමඟ විවිධ පුහුණු වැඩසටහන්, කළමනාකරණ උපදේශනයන්, පුහුණු උපදේශනයන් සහ විභාග පැවැත්වීම සම්බන්ධයෙන් තොරතුරු හුවමාරු කරගන්නා ලද අතර ඉදිරි කටයුතු සම්බන්ධයෙන් ද සාකච්ඡා කරන ලදී.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් නාලක කලුවැව මහතා විසින් මෙම දැනුවත් කිරීමේ සැසිය මෙහෙයවන ලද අතර, එහි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරු සහ ලංකා ඛනිජ තෙල් නීතිගත

සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලන්කන් ගුවන් සමාගම, මහජන බැංකුව, ලංකා බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව ඇතුළු රජය සතු ව්‍යවසායන් තිහක (30) ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෝ මෙම වැඩමුළුව සඳහා සහභාගි වූහ.

සියලුම කළමනාකරුවන් විසින් ඔවුන්ගේ අභියෝග සම්බන්ධයෙන් තොරතුරු බෙදාගත් අතර එම අභියෝග මඟහරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සේවා ලබාගනුයේ කෙසේ ද යන්න පිළිබඳව සාකච්ඡා කරන ලදී. තව ද රජය සතු ව්‍යවසායන්ගේ පුහුණු අවශ්‍යතා ද හඳුනාගන්නා ලදී.

මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නියෝජිතයෝ ද මෙම වැඩමුළුව සඳහා සහභාගී වූහ.





### 16.12 "සරුසාර මාතොට" මැයෙන් වූ මාර්ගගත සම්මන්ත්‍රණය - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ආරම්භ කළ ග්‍රාමීය ආර්ථික සංවර්ධන වැඩසටහන

ආර්ථික ගැටලු උග්‍රවෙමින් පැවති අවධියේ දී ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ අරමුණැතිව මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුලින්ම මෙම වැඩසටහන ආරම්භ කරන ලද්දේ 2022 අප්‍රේල් මාසයේ දී ය. ඉන් අනතුරුව මෙම වැඩසටහන විස්තීර්ණ ග්‍රාමීය ආර්ථික සහ මානව සම්පත් සංවර්ධන මූලාරම්භයක් ලෙස පුළුල් කරන ලදී. මෙකී වැඩසටහන සම්බන්ධයෙන් ආරම්භයේ සිට මේ දක්වාම පවතින සුවිශේෂිතාවය වනුයේ මෙම වැඩසටහන භාණ්ඩාගාර ප්‍රතිපාදන මත රැඳී නොපැවතීම යි.

මෙම "සරුසාර මාතොට" මැයෙන් වූ මාර්ගගත සම්මන්ත්‍රණය ද්විභාෂා මාධ්‍යයෙන් 2023 ජූලි මස 13 වැනි දින ප.ව.2.00 සිට ප.ව.4.00 දක්වා පවත්වන ලදී.

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙම ප්‍රයත්නය සම්බන්ධයෙන් දැනුවත් බවක් ඇති කිරීමට සහ රට පුරා ඔවුන්ගේ අත්දැකීම් ව්‍යාප්ත කිරීම සඳහා මාතර දිස්ත්‍රික් ලේකම් වයි.වික්‍රමසිංහ මහතා සහ "සරුසාර මාතොට" ව්‍යාපෘතියේ උප ව්‍යාපෘති භාර නිලධාරීන් මෙහිදී කථිකයන් වශයෙන් සහභාගී වන ලදී.

### 16.13 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සංක්‍රාන්ති ලිංගිකත්වය නීත්‍යානුකූ කිරීම මැයෙන් පැවති මාර්ගගත සම්මන්ත්‍රණය

"ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සංක්‍රාන්ති ලිංගිකත්වය නීත්‍යානුකූ කිරීම" මැයෙන් වූ මාර්ගගත සම්මන්ත්‍රණය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ 2003 කණ්ඩායම සමඟ සහයෝගීතාවයෙන් පවත්වන ලදී. 2023 දෙසැම්බර් 14 වැනි දින පැවති මෙම මාර්ගගත සම්මන්ත්‍රණයේ දී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සංක්‍රාන්ති ලිංගික ප්‍රජාවගේ නෛතික අයිතිවාසිකම් සම්බන්ධයෙන් පැවති ඉතා වැදගත් සාකච්ඡාවකට Zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධවීමට නිළධාරීන්ට හැකිවිය.

### 16.14 ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පවතින අභියෝග මැයෙන් වූ සම්මන්ත්‍රණය

රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා (HNDIPPCA) පාඨමාලාව හදාරන 2022/23 කණ්ඩායම විසින් ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය (PPP) සම්බන්ධයෙන් පවතින සංකීර්ණ සවිස්තරාත්මක කරුණු විමසා බලමින් අභියෝගාත්මක සම්මන්ත්‍රණයක් ඉදිරිපත් කරන

ලදී. අප රට සංවර්ධනය කරා මෙහෙයවිය හැකි රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වයක් සඳහා පවතින අභියෝග නිරාකරණය කරමින් නව්‍ය විසඳුම් අනාවරණය කරගැනීමේ අරමුණැති මෙම සම්මන්ත්‍රණයේ දී විශේෂඥ අදහස්, අන්‍යෝන්‍ය ක්‍රියාකාරී සාකච්ඡා සහ සවිමත් රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වයන් උදෙසා ඉදිරි දැක්ම ද මෙහිදී ඉදිරිපත් විය.










**16.15 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා වූ ධාරිතා සංවර්ධන වැඩසටහන**

“එකම ඉලක්කයක් කරා සාමූහිකත්වයෙන් යන ගමනේ දී නව්‍ය අත්දැකීමක් එකතු විය” ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සඳහා වූ ධාරිතා සංවර්ධන වැඩසටහන 2023 නොවැම්බර් 12 වැනි දින අවිස්සාවේල්ල පර්පල් සන් රිසෝට්හි දී පැවැත්විණි.






# විගණන කමිටු වාර්තාව - 2023

# 17

2021.11.16 දිනැති අංක 2021/01 දරන රජය සතු ව්‍යවසායන්වල යහ පාලනය සඳහා මාර්ගෝපදේශ චක්‍රලේඛයේ 4.2 පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව, ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණය සහිතව ආයතනයේ අවංකත්වය, ගිණුම්කරණ ප්‍රමිති, මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියට අනුකූලව නියමිත කාලසීමා තුළ සම්පාදනය කරන ගුණාත්මක මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තහවුරු කිරීම සඳහා වන පාලක සභාවේ කටයුතුවලට දැනට පාලක සභාවේ සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විගණන කමිටුව විසින් සහාය දක්වනු ලැබේ.

### 17.1 විගණන සහ කළමනාකරණ කමිටුවේ සංයුතිය

2023 වර්ෂය සඳහා පාලක සභාව විසින් පත්කරනු ලැබූ විගණන කමිටුවේ සාමාජිකයන් මෙසේ ය:

| නම | පත්කරනු ලැබූ දිනය |
|---|---|
| ජුඩ් නිලුක්ෂාන් මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අයවැය දෙපාර්තමේන්තුව | මුලින් පත්කරනු ලැබූ දිනය - 2022.03.02<br>දෙවනුව පත්කරනු ලැබූ දිනය - 2022.11.09 සිට මේ දක්වා |
| වී.ජෙගරාසසිංහම් මිය<br>සාමාජික, පාලක සභාව | 2020.11.09 සිට මේ දක්වා |
| හර්ෂ විජේවර්ධන මහතා<br>අතිරේක ලේකම්<br>අග්‍රාමාත්‍ය කාර්යාලය | 2023.05.30 සිට මේ දක්වා |

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිත, විගණන අධිකාරී ඒ.පී.රේණුකා අල්විස් මහත්මිය, නිරීක්ෂකයෙකු වශයෙන් සහභාගී විය. මීට අමතරව, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා ද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා නිරීක්ෂකයෙකු වශයෙන් සහභාගී විය. සුවිශේෂී කරුණු සම්බන්ධයෙන් විගණන කමිටුව දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විගණන කමිටුව හමුවට වරින්වර කැඳවන ලදී.

2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අභ්‍යන්තර විගණක, කමිටුවේ ලේකම් තනතුරෙහි කටයුතු ඉටු කරන ලදී. වර්ෂය තුළ දී විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් (04) පවත්වන ලදී.

### 17.2 විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යය හා වගකීම්

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 2021/01 ප්‍රකාරව, කමිටුව විසින් පහත දැක්වෙන රජයේ වගකීම් හා අවශ්‍යතා සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදී.

අ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් පරිදි සිදුකිරීම;

ආ. මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා, ආයතනික පනත්, චක්‍රලේඛවලට අදාළ තොරතුරු අවශ්‍යතා සහ අනෙකුත් අදාළ මූල්‍ය වාර්තාකරණයට සම්බන්ධිත රෙගුලාසි හා අවශ්‍යතාවල අනුකූලතාවය;

ඇ. අස්තිත්වයේ අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ පටිපාටි ශ්‍රී ලංකා විගණන ප්‍රමිත සහ රජය විසින් වරින් වර නිකුත් කරන චක්‍රලේඛවල අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් බවට තහවුරු කිරීම සඳහා ක්‍රියාවලි;

ඈ. අස්තිත්වයේ අභ්‍යන්තර විගණන කාර්යයයේ කාර්ය සාධනය සහතික කිරීම;
ඉ. අවදානම් කමිටුවක් ක්‍රියාත්මක නොවන අවස්ථාවන්හි දී වැදගත් ව්‍යාපාරික/ මූල්‍ය අවදානම් හඳුනාගැනීම, අධීක්ෂණය හා කළමනාකරණය;
ඊ. පාලක සභාවේ සාමාජිකයන්ගේ හා ප්‍රධාන කළමනාකරණ පිරිස්වල ආශ්‍රිත පාර්ශව ගනුදෙනු පිළිබඳව වාර්තා කිරීම.

**17.3 2023 වර්ෂයේ පැවති විගණන කමිටු රැස්වීම්වලදී සාකච්ඡා කරනු ලැබූ න්‍යාය පත්‍රයේ ප්‍රධාන අයිතම පහත දැක්වෙන පරිදි වේ.**

| රැස්වීම් අංකය සහ දිනය | සාකච්ඡා කළ ප්‍රධාන කාර්යයන් |
|---|---|
| 2023/01 - 21.02.2023 | • අභ්‍යන්තර සහ බාහිර විගණන සම්පිණ්ඩන වාර්තාව සහ අවධානිත ගැටලු.<br>- නේවාසිකාගාර පහසුකම් වෙන් කිරීම සහ නඩත්තු කිරීමේ කළමනාකරණ පද්ධතිය<br>- පංති කාමර වෙන්කිරීම සහ නඩත්තුව සඳහා විධිමත් පද්ධතිය<br>- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය කළමනාකරණය කිරීමේ පද්ධතිය සහ අතුරු නීති සකස් කිරීම<br>- ආපනශාලාවේ කළමනාකරණ පද්ධතිය<br>• දුරස්ථ ඉගෙනුම් සහ වීඩියෝ සාකච්ඡා ඒකකය පිළිබඳ වාර්තාව |
| 2023/02 - 12.06.2023 | • 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (අ) වගන්තිය ප්‍රකාරව, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ සාරාංශය.<br>• 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව.<br>• අභ්‍යන්තර විගණන වාර්තා සහ අවධානිත ගැටලු සහ කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය<br>- නුවරඑළියේ සංචාරක බංගලාව කළමනාකරණ පද්ධතිය<br>- 2022 වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සහ මානව සම්පත් කළමනාකරණ පද්ධතිය<br>- පොදු මූල්‍ය කළමනාකරණ පද්ධතිය සහ ගැටලු<br>• දුරස්ථ e- ඉගෙනුම් ජාලය ස්ථාපනය කිරීමට අදාළව ගෙවීමට තිබෙන මුදල<br>• ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ සේවාරම්භක පුහුණු වැඩසටහනෙහි ගෙවිය යුතු මුදල |
| 2023/03 - 05.10.2023 | • පහත ක්ෂේත්‍රවල අභ්‍යන්තර විගණන වාර්තාව සහ අවධානිත ගැටලු<br>- පුස්තකාල සේවා ස්වයංක්‍රීයකරණය සහ විධිමත් පද්ධතිය වැඩිදියුණු කිරීම<br>- පර්යේෂණ සහ කළමනාකරණ නොවන මට්ටමේ පුහුණු පද්ධතිය<br>- ඩයලොග් ආයතනය වෙත සිදුකළ යුතු ගෙවීම් පියවීම<br>• වත්කම් ලේඛනය<br>• අපහරණය කළයුතු වත්කම් වාර්තාව |
| 2023/04 - 29.12.2023 | • අභ්‍යන්තර විගණන වාර්තා සහ අවධානිත ගැටලු සහ කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය<br>- බාහිර සහ අභ්‍යන්තර විභාග පැවැත්වීම<br>- රාජ්‍ය කළමනාකරණ පශ්චාත් උපාධි විභාග පද්ධතිය සහ ලැබිය යුතු සහ ගෙවිය යුතු<br>- විභාග අංශයේ කාර්ය පටිපාටි මාර්ගෝපදේශ සංග්‍රහය<br>• අභ්‍යන්තර විගණන සැලැස්ම හා අවදානම් ලේඛනය - 2024<br>• ව්‍යවස්ථාපිත වගකීම් පිළිබඳ තත්ත්වය |

### 17.4 ප්‍රධාන නිරීක්ෂණ සහ නිර්දේශ

| නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|
| භාණ්ඩ සමීක්ෂණ වාර්තා, වත්කම් ලේඛනය, අපහරණ ලේඛනය සම්බන්ධයෙන් කටයුතු කිරීම | • මෙම කාර්යය නිමා කිරීමෙන් අනතුරුව 2023 වර්ෂයේ අවසන් ගිණුම්වල වත්කම්වල අගය නිවැරදි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.<br>• ගිණුම් අංශයේ වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට නිර්දේශ කිරීම. |
| නුවරඑළිය බංගලාවේ පරිපාලන කටයුතු | • බංගලා භාරකරුවෙකු පත් කිරීම හා එය ක්‍රියාත්මක කිරීම |
| අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ප්‍රකාරව පනත සංශෝධනය කිරීම | • APA/13/0237/523/011 සහ APA/20/2066/315/017 අනුව පනත සංශෝධනය කළ යුතු බව |
| රාජ්‍ය කළමනාකරණ පශ්චාත් උපාධිය සඳහා අතුරු නීති සකස් කිරීම | • අවශ්‍යතානුකූලව අතුරු නීති සකස් කිරීම |
| පර්යේෂණ සහ කළමනාකරණ නොවන මට්ටමේ පුහුණු වැඩසටහන් | • පර්යේෂණ අංශය සඳහා පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගැනීමට නිර්දේශ කරන ලදී.<br>• මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ කළමනාකරණ නොවන මට්ටමේ පුහුණු වැඩසටහන් පැවැත්වීමට නිර්දේශ කරන ලදී. |
| දුරස්ථ e - ඉගෙනුම් ජාලය ස්ථාපනය කිරීමට අදාළව ගෙවීමට තිබෙන මුදල | • උපචිත ලැබිය යුතු සහ ගෙවිය යුතු දෑ නිරවුල් කිරීම සඳහා පාලක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම |

**මූල්‍ය වාර්තාකරණය**

පාර්ශවකරුවන් වෙත ලබාදෙන තොරතුරුවල විශ්වාසනීයත්වය තහවුරු කිරීම සඳහා කමිටුව විසින් දැනට ක්‍රියාත්මක වන මූල්‍ය වාර්තාකරණ ක්‍රමයේ සඵලතාවය සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ පොත් හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා පාලක සභාවට ඇති වගකීම ඉටු කිරීමෙහිලා කමිටුව විසින් පාලක සභාව වෙත සහාය වනු ලැබේ. සියලුම ගනුදෙනු නිරවද්‍ය ආකාරයෙන් හා සම්පූර්ණයෙන් ගිණුම්කරණ පොත්වල වාර්තාවන බවට සාධාරණ සහතික කිරීමක් ලබාදීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවල හා කාර්ය පටිපාටිවල ප්‍රමාණවත්බව හා සඵලතාවය කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සිදුකරන වැදගත් උපකල්පන හා විනිශ්චයන් ද අන්තර්ගත උපකාරී තොරතුරු ද ඇතුළුව සියලුම කාර්තුමය වශයෙන් වන විගණනය නොකළ අතරමැදි මූල්‍ය ප්‍රකාශන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.

**අභ්‍යන්තර පාලනය**

මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සම්බන්ධයෙන් පවතින අභ්‍යන්තර පාලනයේ සඵලතාවය විගණන කමිටුව විසින් තක්සේරු කරන ලදී. මෙම ක්‍රියාවලිය ඔස්සේ නීති හා රෙගුලාසිවල පවතින අනුකූලත්වය තහවුරු කිරීමට අවදානම් පාලනය සඳහා පවතින අභ්‍යන්තර පාලනවල ප්‍රමාණවත්බව හා සඵලතාවය සහ ක්‍රියාවලි තක්සේරු කරනු ලැබේ. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අභ්‍යන්තර පාලන ක්‍රමවල සඵලතාවය වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරුන් විසින් ලබාදෙන නිර්දේශ සම්බන්ධයෙන් යෝග්‍ය ක්‍රියාමාර්ග කළමනාකාරීත්වය විසින් ගැනීම කමිටුව විසින් සහතික කරනු ලැබේ. අභ්‍යන්තර පාලන රාමුවේ පදනම මගින් පාලක සභාව වෙත එහි කාර්යයන් අඛණ්ඩව සිදුකිරීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා හැකියාව ලබාදේ.

**අභ්‍යන්තර විගණන කටයුතු**

අභ්‍යන්තර විගණන කාර්යය, විගණනය කරනු ලබන ක්‍රියාකාරකම්වලින් ස්වාධීන බවට විගණන කමිටුව විසින් සහතික කෙරේ. වාර්ෂික විගණන සැලැස්මට අනුව අපක්ෂපාතීව, නිපුණතාවයෙන් හා නිසි වෘත්තීය සුපරීක්ෂාකාරීබවකින් එය සිදුකරන බවටත් විගණනය කර සහතික කෙරේ. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අභ්‍යන්තර විගණන අංශයේ ක්‍රියාකාරකම්වල විෂය පථය, සම්පත්, වපසරිය හා ඵලදායිබව අධීක්ෂණය කිරීම හා සමාලෝචනය කිරීම විගණන කමිටුව විසින් සිදු කරන ලදී.

**ජූඩ් නිලුක්ෂාන්**
සභාපති
විගණන සහ කළමනාකරණ කමිටුව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PAF/B/SLIDA/01/23/03 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2024 මැයි 31 දින

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

(i) ප්‍රමිතයෙහි 42 ඡේදය ප්‍රකාරව, ගොඩනැගිලි වටිනාකමෙහි, ධාරණ අගය වාර්තා කරන දිනට වූ සාධාරණ වටිනාකම භාවිතා කරමින් ප්‍රත්‍යාගණනය කර නොතිබුණු අතර 2016 වර්ෂයේ තක්සේරු වටිනාකම පදනම් කර ගනිමින් ගොඩනැගිලි වටිනාකම රු.404,961,000 කට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ii) ප්‍රමිතයෙහි 92 (ආ) ඡේදය ප්‍රකාරව පිරිවැය රු.266,931,869ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වලින් තවමත් භාවිතා කරන වත්කම්වල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි

(ආ) 2016 සැප්තැම්බර් 27 දිනැති අංක අමප/16/1826/734/023 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් නිදහස් දීමනාවක් ලෙස ආයතනය වෙත පවරා දී තිබූ නුවරඑළිය සංචාරක බංගලාව හා ඉඩම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ගත්මිල වටිනාකම රු.2,940,696ක් වූ මෘදුකාංග පැකේජය සමාලෝචිත වර්ෂයේ සම්පූර්ණයෙන් ක්ෂය කළ වත්කමක් ලෙස සැලකීම හේතුවෙන් වර්ෂයට අදාළ රු.588,139 ක ක්ෂය අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) වාහන සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.8,999,190 ක් ක්ෂය කරනු වෙනුවට රු.9,384,190ක් ක්ෂය කිරීම හේතුවෙන් රු.385,000ක් වැඩියෙන් ක්ෂය ගිණුම්ගත කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

2

### 1.3 ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම හා එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

3

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

4

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

5

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ "අ" හි දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීති, රීති / විධානයට යොමුව | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 10 (05) වගන්තිය | විසර්ජනයකින් පසු ඉතිරි වන ශුද්ධ ආදායම ඒකාබද්ධ අරමුදලට යැවිය යුතු වුවත් ආයතනය එයට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1982 අංක 9 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පනතේ 31 වන වගන්තිය | කිසිදු නීතියක් අමාත්‍යවරයා අනුමත කරන තුරු බලාත්මක නොවන නමුත් පශ්චාත් උපාධි අධ්‍යයන අංශයේ අතුරු නීති සංග්‍රහය (By Laws) සඳහා අදාල අනුමැතිය ලබා ගැනීමකින් තොරව පශ්චාත් උපාධි අංශයේ මාර්ගෝපදේශයක් වශයෙන් භාවිතා කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව,

## 2.3 වෙනත් කරුණු

(අ) ආයතනය පිහිටුවා ඇති අංක 28/10 මලලසේකර මාවතේ පිහිටි හෙක්ටයාර් 1.1863 ක් වූ ඉඩම 1968 වර්ෂයේ සිට භාවිතා කරනු ලැබුව ද පවරා ගැනීමේ කටයුතු මෙතෙක් අවසන් කර නොතිබුණි.

(ආ) 2013 පෙබරවාරි 07 දිනැති අංක 13/0150/523/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ආයතනය පිහිටවනු ලැබූ පනත සංශෝධනය කිරීමට අනුමැතිය ලබා දී තිබුණ ද එය සිදුකර නොතිබුණි.

(ඇ) 2013 අප්‍රේල් 19 දිනැති අංක 13/0237/523/011 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ගන්නා ලද තීරණ ක්‍රියාත්මක නොකිරීම.

(i) ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට ද්විතීයන පදනම මත නිලධාරීන් බඳවා ගැනීමේදී ප්‍රසිද්ධ දැන්වීම් මගින් ඉල්ලුම්පත් කැඳවා බඳවා ගැනීම වෙනුවට, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකර බඳවා ගැනීම.

(ii) රාජ්‍ය නිලධාරීන්ගේ දැනුම හා කුසලතා තව තවත් ඉහළ නැංවීමට හා ඔවුන්ගේ ආකල්පවල වඩාත් ධනාත්මක වෙනසක් ඇති කිරීමට හැකි වන පරිදි ආයතනය විසින් පවත්වනු ලබන පුහුණු පාඨමාලාවන්හි අන්තර්ගතය, පුහුණුවීම් ක්‍රමවේද විමර්ශනයට ලක්කොට ඒවා යලි

7

සැකසීම සම්බන්ධයෙන් මාස දෙකක් ඇතුළත අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම.

(iii) රාජ්‍ය නිලධාරීන්ට රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණය සම්බන්ධයෙන් පුහුණුව ලබා දීම සඳහා ආයතනය කටයුතු කළ යුතු වුවත්, රාජ්‍ය අංශයේ විධායක නිලධාරීන් පුහුණු කිරීම සඳහා විශේෂ අවධානය යොමුකර ක්‍රියාකර තිබීමෙන් විධායක නොවන සේවාවල නිලධාරීන් පුහුණු කිරීමේ කාර්යය මඟහැරී තිබීම.

(ඈ) 2008 වර්ෂයේදී නිකුත් කරන ලද අංක පිඩී/අයිසී/2008 දරන අභ්‍යන්තර චක්‍රලේඛයට අනුව ආයතනයේ සේවයේ නියුතු උපදේශකවරුන්ට ද්විතියන අධ්‍යයන දීමනාව මූලික වැටුපෙන් සියයට 50 ක් ලබා ගැනීමට මසකට මිනිස් පැය 45ක දේශන පැය ප්‍රමාණයක් සම්පූර්ණ කළ යුතු වුවත්, එම දේශන පැය සම්පූර්ණ කර නොතිබියදීත් දීමනා ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ මුල් මාස 07 සඳහා පමණක් සිදුකර තිබුණු ගණනය කිරීම් අනුව උපදේශකවරුන් 10 දෙනෙකු වෙත රු.2,792,232ක් දීමනා වශයෙන් ගෙවා තිබුණද, එම උපදේශකවරුන් විසින් ආවරණය කළයුතු පැය ගණන 3240ක් හා ආවරණය කළ සත්‍ය පැය ගණන 1392.5ක් වූයෙන් පුහුණු දේශන පැය 1847.5 ක් ආවරණය කර නොතිබුණි.


(ඉ) පශ්චාත් උපාධි පාඨමාලා අතහැර ගිය නිලධාරීන් 43 දෙනෙකුගෙන් රු.10,869,375ක් අවුරුදු 01ත් 05 ත් අතර කාලයක සිට අය නොවී පැවතුණි.

(ඊ) ඉකුත් වර්ෂවලදී ප්‍රාග්ධන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද එහෙත් උපයෝජනය නොකර ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇති මුදල රු.25,323,146 ක් විය.

(උ) වර්ෂ 06කට වැඩි කාලයක සිට අයනොවී පවතින රු.1,933,325ක ලැබිය යුතු ශේෂ 20 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

8



ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, රාජ්‍ය පරිපාලන හා කළමණාකරණය පිළිබඳ දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය අංශයේ පුහුණු ආයතනයයි. කළමනාකරණ පුහුණුවලට අමතරව කළමනාකරණ උපදේශන සේවා සැපයීම හා පර්යේෂණ කළමනාකරණයට අදාල සේවා සැපයීම මෙන්ම ආයතනික කළමනාකරණ ක්‍රමවේදයන් සමාලෝචනය හා වැඩිදියුණු කිරීම ද මෙම ආයතනයේ කාර්යභාරයට අයත් වේ. මෙය 1982 අංක 09 දරණ පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවනු ලැබූ ආයතනයකි.

இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம் என்பது, பொது நிர்வாகம் மற்றும் முகாமைத்துவத்தில் அறிவை மேம்படுத்துவதற்கும் திறன்களை மேம்படுத்துவதற்கும், இலங்கையின் முதன்மையான பொதுத்துறை பயிற்சி நிறுவனமாகும். முகாமைத்துவ பயிற்சி நடவடிக்கைகளுக்கு மேலதிகமாக, ளுடுஐனுயு ஆனது முகாமைத்துவ ஆலோசனை சேவைகள் மற்றும் முகாமைத்துவத்தின் அடையாளம் காணக்கூடிய செயற்பாட்டுப் பகுதிகளை அபிவிருத்தி செய்வதற்கும் நிறுவன அமைப்புகளை மீளாய்வு செய்வதற்கும் மேம்படுத்துவதற்கும் மேற்கொள்ளும்.

Sri Lanka Institute of Development Administration (SLIDA) is the premier public sector training organization in Sri Lanka, for the development of knowledge and improvement of skills in Public Administration and Management. In addition to management training activities the SLIDA also undertakes Management Consultancy Services and Research to develop identifiable functional areas of management as well as review and improve organizational systems.




**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය**
**இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்**
**SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION**

28/10, Malalasekara Mawatha, Colombo 07, Sri Lanka.
Tel: +94-11-5980200 | Email: info@slida.gov.lk
Web: www.slida.lk


PRINTEC | 0112 815 816